# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

# 2011/2012



ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය (සංස්ථාපිත)
இலங்கை பசுமை இயக்கம் (கூட்டிணைக்கப்பட்டது)
The Green Movement of Sri Lanka Inc.

# වාර්ෂික වාර්තාව - 2011/2012

ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය (සංස්ථාපිත)

# පෙරවදන

විවිධ ක්ෂේත්‍රයන් තුළ ප්‍රජාවට අවැසි අයුරින් සිදු කළ යම් මෙහෙයයන් අතර දැවැන්ත සංවර්ධන ක්‍රියාවලීන් තුලින් සිදු වන්නට ගිය විනාශයන් අවම කර ගැනීම, දැවැන්ත වන සංහාරය අවම කර ගැනීම, අරපිරිමැස්මෙන් ආර්ථිකයත්, පරිසරයත් සුරකිමින් වැඩි වන ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට ප්‍රජාව සවිබල ගැන්වීම හා ආපදාවන්ට ලක්වූවනට සහන සැලසීම වැනි කාර්යයන්ට දායක වීමට හැකි වීම ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය ලද භාග්‍යයකි.

අද අප ජීවත් වන ලෝකයේ සොබාදහමට එරෙහිව මිනිසා විසින් සිදු කරන ලද අකටයුතුකම් වලට ප්‍රතිචාර ලෙස එම සොබාදහම් පද්ධතිය කුපිතව පෙරලා ප්‍රතිචාර දක්වන්නට පටන් ගැනීමෙන් මුළු ලොවම බියෙන් ඇලලී ගොස් ඇත.

සිදුවෙමින් පවතින අර්බුදය හමුවේ එයට තිරසාර විසඳුම් සොයමින්, විපතට පත්වන්නන්ට උපකාර කරමින් ඔවුන් දැනුමින් - දහමින් - ක්‍රමෝපායන්ගෙන් සවිබල ගන්වමින් අකම්පිතව ඉදිරියට යන්නට කැපවූ අපගේ අභිලාශය - ජවය - එකමුතුකම තව තවත් වර්ධනයට රුකුලක් වී ඇත.

ජාත්‍යන්තර සහ කළාපීය වශයෙන් යහපත් හෙටක් නිර්මාණය කිරීමට බලපෑම් කළ හැකි බලගතු කණ්ඩායම් අතර කැපී පෙනෙන නියෝජනයන් ද පසුගිය වර්ෂයන් තුල සිදු විය. එසේම නීතිමය වශයෙන් හා සංරක්ෂණ ව්‍යාපාර ඔස්සේ බලපෑම් කිරීම තුලින් ජාතික මට්ටමේ තීරණ ගනු ලබන විවිධ වේදිකාවන්හි නියෝජනයට අවස්ථාවද උදා වුනි.

ඒ බව සනිටුහන් වන මෙම මොහොතේ සහයෝගයෙන් - සාමූහිකත්වයෙන් - සහජීවනයෙන් බැඳි අපේ සව්මත් සබඳකම තවදුරටත් ශක්තිමත් කොට ලොව හිත සුව පිණිස විසඳුම් සොයන ප්‍රඥා බල සෙනඟ රොක්වන නවාතැනක් සේ බලමුළු ගැන්වෙමු.

# පටුන

පිටු අංකය


| | | | |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය | | 1 |
| 2. | උපදේශක මණ්ඩලය | | 3 |
| 3. | ප්‍රධාන වැඩසටහන් | | |
| | 3.1 | ස්වාභාවික සම්පත් සංරක්ෂණ හා කළමනාකරණ වැඩසටහන (NRCM) | 4 |
| | 3.2 | ආහාර ස්වෛරීභාවය හා තිරසර ගොවි කටයුතු පිළිබඳ වැඩසටහන (FSSAP) | 10 |
| | 3.3 | යහ පාලනය හා ඒකාබද්ධ වැඩසටහන (PCADE) | 12 |
| | 3.4 | දේශගුණික විපර්යාස පිළිබඳ පොදුජන ලේකම් කාර්යාලය (සිහිල් දියත) | 14 |
| | 3.5 | ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව කළමනාකරණ  ව්‍යාපෘතිය (CBM) | 17 |
| | 3.6 | සාගර හා වෙරළ ආශ්‍රිත සම්පත් සංරක්ෂණය හා කළමනාකරණ වැඩසටහන (MCRCMP) | 20 |
| | 3.7 | ලුණුගම්වෙහෙර වම් ඉවුර සංවර්ධන වැඩසටහන | 22 |
| | 3.8 | ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන | 24 |
| | 3.9 | තුරුණු මිහිසරණිය හරිත සේනාංකය | 26 |
| 4. | වෙනත් ක්‍රියාකාරකම් | | 27 |
| 5. | ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ වැඩසටහන් කළමනාකරුවන් | | 30 |
| 6. | විධායක කමිටු සාමාජිකයින් | | 31 |
| 7. | 2011/2012 වර්ෂයේ සාමාජික සංවිධාන ලේඛනය | | 32 |
| 8. | 2011/2012 වර්ෂයේ ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ ජාතික හා අන්තර්ජාතික නියෝජනයන් | | 37 |
| 9. | ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ කාර්ය මණ්ඩලය 2011/2012 | | 38 |
| 10. | වාර්ෂික විගණන වාර්තාව | | 40 |

# 1. ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය

ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ පාරිසරික සංවර්ධන උපදේශන කණ්ඩායම් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා තිරසාර සංවර්ධනයක් උදෙසා කටයුතු කරන ලංකාව පුරා විසිරුණු ප්‍රජා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන 140 කින් හා ජාත්‍යන්තර සංවිධාන 80කින් සැදුම් ලත් සංස්ථාපිත ආයතනයකි. එසේම ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයෙහි අරමුණ වන සැමට සාධාරණ, සංතෘප්තිමත්, සංවර්ධන ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා පුද්ගල සම්බන්ධතා 4000 කට වැඩි පිරිසකගේ ද දායකත්වය හිමිය.

මිනිසුන්ගේ චින්තනය වෙනස් කිරීම තුළින් ඔවුනගේ යහ පුරුදු හා ආකල්ප ඇති කිරීම හරහා තිරසාර ප්‍රවේශය මිනිසුන් තුළ අළුත් පුරුදු සහ ක්‍රියාකාරකම් ක්ෂණිකව ඇති කිරීමට යාමට වඩා තිරසර ලෙස ඔවුනගේ චින්තනයෙහි වෙනසක් ඇති කිරීමේ ප්‍රවේශයකි. පාරිසරික සංරක්ෂණය, යහ පාලනය, ජීවන වෘත්තීන් ආරක්ෂා කිරීම හා ප්‍රතිස්ථාපනය, ගැටුම් නිරාකරණය, ආහාර ස්වාධිපත්‍ය, පාරිභෝගික ආරක්ෂණය, ජෛව විවිධත්ව සංරක්ෂණය, බලශක්තිය හා විදුලිය, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව හා තාරුණ්‍යය යන පැතිරුණු සමාජ ව්‍යුහය තුළ වූ ගැටලු හා අවස්ථාවන්ට ඍජුව මැදිහත් වෙමින් හරිත ව්‍යාපාරය ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය විවිධ ක්ෂේත්‍රයන් තුළ ප්‍රජාවට ඇවැසි අයුරින් සිදු කළ යම් මෙහෙයන් අතර දැවැන්ත සංවර්ධන ක්‍රියාවලින් තුළින් සිදු වන්නට ගිය විනාශයන් අවම කර ගැනීම, පාරිසරක පද්ධති දැවැන්ත වන සංහාරය අවම කිරීම, අරපිරිමැස්මෙන් ආර්ථිකයත් පරිසරයත් සුරැකි, වැඩිවන ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට ප්‍රජාව සවිබල ගැන්වීම හා ආපාදාවට ලක් වූවන්ට සහන සැලසීම වැනි කාර්යයන්ට දියක වීමට හැකි වීම ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය ලද භාග්‍යයකි.

ජාත්‍යන්තර හා කලාපීය වශයෙන් යහපත් හෙටක් නිර්මාණය කිරීමට බලපෑම් කළ හැකි බලගතු කණ්ඩායම් අතර කැපී පෙනෙන නියෝජනයන් ද පසුගිය වර්ෂයන් තුළ සිදු විය. එසේම නීතිමය වශයෙන් හා සංරක්ෂණය, සංරක්ෂණ ව්‍යාපාර ඔස්සේ බලපෑම් කිරීම තුලින් ජාතික මට්ටමේ තීරණ ගනු ලබන විවිධ වේදිකාවන් හි නියෝජනයට අවස්ථාව උදා වුනි.

**අපගේ විශ්වාසය හා හෘදයාංගම බැඳීම**

- සත්‍ය දැක කිසිදු බියකින්, බැඳීමකින් හෝ මඟහැරීමකින් තොරව සත්‍ය ප්‍රකාශ කිරීම.
- පුද්ගල ශක්තීන්, දුර්වලතා, අදහස් හා න්‍යාය පත්‍ර නොසලකා සැමට කරුණාවන්ත වීම.
- ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට, අපගේ සහකරුවන්ට හා හිතවතුන්ට වගකීමෙන් යුක්ත වීම.
- සෑම ක්‍රියාකාරකමකදීම විනිවිදභාවය ආරක්ෂා කිරීම.
- ස්වභාවධර්මයට හා මිනිසුන්ට හානි, පීඩා ගෙනදෙන කිසිදු ක්‍රියාකාරකමකට සහාය නොදැක්වීම.

## ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ දැක්ම

මිහිතලයේ ඇති වෘක්ෂලතාවන්ගේ, සත්ත්ව වර්ගයාගේ, එහි ජීවත් වන මිනිසුන්ගේ සහජීවනය හා එකමුතු බව උදෙසා සේවය කිරීම, පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කරන ක්‍රම තුළින් ඔවුන්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීම.

**ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ මෙහෙවර**

විශ්ව පරිසරයේ දැනුවත් බව සඳහා පෙළඹවීම හා ගුණාත්මක මනුෂ්‍ය දිවිපෙවෙතේ කොටසක් ලෙස එය ආරක්ෂා කිරීම.

**ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ හර පද්ධතීන්**

- මිනිසුන් සංකල්පාත්මක හා ප්‍රායෝගිකව පරිසර හිතකාමී මගකට යොමු කරන අතර තිරසර සංවර්ධනය උදෙසා සාමූහික පියවරක් තැබීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- චිරස්ථායී සංවර්ධන රාමුවක් ඇති කරන ලෙස රජයට අඛණ්ඩව බල කිරීම.

- තිරසර සංවර්ධන ක්‍රියාකාරකම් තුළ යථාර්ථවාදීව හා ප්‍රායෝගිකව නියැලී සිටින සජීවීකරණය වූ ප්‍රජාවන් සුරක්ෂිත කිරීම පිණිස අධ්‍යාපන හා පුළුල් පර්යේෂණ පැවැත්වීම.

- සංවර්ධන කේන්ද්‍රගත පාරිසරික, පාරිභෝගික කරුණු වලදී අසාධාරණයන්ට ලක්වූවන්ට අත්වැලක් වීමට නීතිමය රාමුවක් පිහිටුවීම.

- වැඩසටහන් හා ක්‍රියාකාරකම් වලට අවශ්‍ය වන්නා වූ පහසුකම් මනාව සැපයීමට ඵලදායී පහසුකම් අධීක්ෂණය හා ඇගයීම් යාන්ත්‍රණයක් පිහිටුවීම.

# 2. උපදේශක මණ්ඩලය

- පූජ්‍ය මහමාන්කඩවල පියරතන හිමි,
  ගරු සභාපති- එප්පාවල පොස්පේට් නිධිය රැකගැනීමේ කමිටුව හා ස්වාභාවික සම්පත් ආරක්ෂාකරන්නන්ගේ සංගමය

- ආචාර්ය එච්.එල්. සුමතිපාල,
  දේශගුණික විපර්යාස ප්‍රධානී- දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

- ආචාර්ය චම්පා නවරත්න,
  කෘෂිකර්මය, රුහුණු විශ්ව විද්‍යාලය

- ආචාර්ය සමන්ත සුරන්ජන්,
  උද්භිද විද්‍යාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

- මහාචාර්ය එස්. බී. සුබසිංහ,
  කෘෂිකර්මය, රුහුණු විශ්ව විද්‍යාලය

- ආචාර්ය කේ. ඩී. රේණුක සිල්වා,
  පීඨාධිපති, පශු සම්පත් ධීවර සහ පෝෂණ විද්‍යාපීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

- මහාචාර්ය ජේ.එම්.එස්. බණ්ඩාර,
  කෘෂි ජීව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

- ධනේෂ් විසුම්පෙරුම,
  පරිසරවේදී, කොළඹ විශ්ව විද්‍යාලය

- සේනක බණ්ඩාර,
  කෘෂි විද්‍යා පශ්චාත් උපාධිධාරී, රුහුණු විශ්ව විද්‍යාලය

- ජගත් ශාන්ත වර්ණකුල,
  විෂයභාර නිලධාරී,පැළෑටි සංරක්ෂණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- ඩී. ආර්. ගුණරත්න,
  බාහිර කථිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය හා කොළඹ විශ්ව විද්‍යාලය

- පී. බී. සමරසිංහ,

  කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

# 3. ආයතනයේ ප්‍රධාන වැඩසටහන්

## 3.1 ස්වාභාවික සම්පත් සංරක්ෂණ හා කළමනාකරණ වැඩසටහන (NRCM)

### ක්‍රමවේදය

- ජාතික කමිටු නියෝජනය,
- ආයතනික නිළධාරීන් සමඟ නිසි සම්බන්ධීකරණය පවත්වා ගැනීම,
- තොරතුරු ගොනු පවත්වා ගැනීම, යාවත්කාලීන කිරීම සහ අධ්‍යයනය කිරීම,
- ප්‍රජාව දැනුවත් කිරීම, සංවිධාන ගත කිරීම සහ අවශ්‍යය පහසුකම් සැපයීම,
- අදාල බලධාරීන් මඟින් යුක්තිය ඉටුකර ගැනීම සඳහා බලපෑම් කණ්ඩායමක් වශයෙන් ක්‍රියාත්මක වීම.
- ආයතනිකව හෝ ප්‍රජාව සවිබල ගැන්වීම මඟින් පාරිසරික ගැටළු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම,
- නීති හා ප්‍රතිපත්ති ගැටළු සම්බන්ධව අදාල ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම,

### පාරිසරික ගැටළු නිරාකරණය

- ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ වංචනික ලෙස වනාන්තර වලට හානිදායකව පවත්වාගෙන ගිය ගල් කැඩීම හා සම්බන්ධව අදාල ආයතන දැනුවත් කර වැටලීම් සිදුකරලීම.
- පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ රජයේ නිළධාරීන් හා ප්‍රදේශවාසීන් එකතුව ව්‍යාජ ලිපි ලේඛන පිළියෙල කර සිදුකල දැව ජාවාරම නැවැත්වීම.
- මඩු පල්ලි රක්ෂිතය තුල සිදුවූ දැව ජාවාරම නැවැත්වීම. එම වැරදිකරුවන් නීතිය හමුවට පමුණුවාලීම.
- මඩකලපුව කෝරළේ රක්ෂිතය දැව කැපීම පිළිබඳව අදාල ආයතන දැනුවත් කොට සිදුවූ වන විනාශය නැවැත්වීම.
- නිලාවේලි, පරෙවි දුපත සමුද්‍ර උද්‍යානය ඉවත්කිරීම හා ඒ ආශ්‍රිතව සිදුවන නීතිවිරෝධී කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- දකුණු ඉන්දියාවේ පිහිටුවන න්‍යෂ්ටික බලාගාර මඟින් දෙපාර්ශවයටම සිදුවිය හැකි හානි පිළිබඳව ශ්‍රී ලංකා ජනාධිපතිතුමා, ඉන්දියානු මහ කොමසාරිස්තුමිය හා ග්‍රීන් පීස් ඉන්දියා ඇතුළු අන්තර්ජාතික රාජ්‍යය නොවන සංවිධාන කිහිපයක් දැනුවත් කිරීම.



- ජාතික වනෝද්‍යාන වල ප්‍රේරිත කළාපය තුල ඉදිකිරීම් සිදුකිරීමට විරුද්ධව කටයුතු කිරීම.
- නුවරඑළිය, බෝඹුරු ඇල්ල රක්ෂිතය මායිමේ එම රක්ෂිතයට හානි වන පරිදි රාත්‍රී කාලයේ සිදුකළ එළවළු සේදීමට විරුද්ධව කටයුතු කිරීම සහ එම කටයුතු වල නියැලෙන පුද්ගලයන් දැනුවත් කිරීමට ක්‍රියා කිරීම.
- උඩුදුම්බර මාර්ගය පුළුල් කිරීමේ ගැටළු හා 18 වංගුව විකල්ප මාර්ගය භාවිතයේ ඇති වාසි පිළිබඳව ජනාධිපතිතුමා දැනුවත් කිරීම.
- කැළණිමුල්ල තේ කර්මාන්තශාලාව මඟින් සිදුවන පාරිසරික හා මහජන පීඩාව පිළිබඳව අදාල ආයතන දැනුවත්කොට ඒ සඳහා සාර්ථකව පිළියම් යෙදීම.
- වැව් 27 ක් සඳහා ජලය සපයන වේළිඹය ව්‍යාපෘතියෙහි ජල පෝෂක ප්‍රදේශයේ අක්කර 627 ක වනාන්තර ප්‍රදේශයක් එළිකොට ඉදිකිරීමට සැළසුම් කළ බෙරගල ඉකෝ ගොල්ෆ් රිසෝට් හෝටලය සම්බන්ධයෙන් අදාල ආයතන සහ ජනතාව දැනුවත් කොට එම ව්‍යාපෘතිය අත්හිටුවීම.
- වනජීවී නිළධාරීන්ගේ අකුරට වැඩකිරීමේ වෘතීය ක්‍රියාමාර්ගයට සමගාමීව ඔවුන්ගේ සුභසාධනය සම්බන්ධව පවතින ගැටළු සහ වැටුප් තල වල පවතින විෂමතා සම්බන්ධයෙන් ජනාධිපතිතුමා සහ විෂයභාර ඇමතිතුමා දැනුවත් කිරීම සහ ඒ සඳහා සාර්ථක විසඳුම් ඒ මාර්ගයෙන් ලබා ගැනීම.
- දහයියාගල අලිමංකඩ දෙපස විදුලි වැට ඉදිකිරීම සම්බන්ධව පැණ නැඟුනු අර්බුධකාරී තත්ත්වය අදාල ආයතන මාර්ගයෙන් සහ ජනතාව දැනුවත් කිරීම තුලින් යථා තත්ත්වයට පත්කොට විදුලි වැට ඉදි කරදී ප්‍රදේශවාසීන්ගේ ජනජීවිතය යථා තත්වයට පත් කිරීම.
- පටපිළිකන්ද රක්ෂිත භූමිය තුල ඉදිකල අනවසර ඉදිකිරීම වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- රට තුල පවතින රබර් වගාවන් ඉවත් කොට ඒ තුල කටුපොල් වගාව ව්‍යාප්ත කිරීමට එරෙහිව ව්‍යාපාරයක් පවත්වන ලදී. එමඟින් ජනතාව දැනුවත් කිරීම හරහා කටුපොල් වගාවන්ට එරෙහිව ජනතාව ඒකරාශී කිරීම.
- ආසනික් ප්‍රමුඛ විෂ සහිත රසායන ද්‍රව්‍ය කෘෂි රසායන සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් රටට හෙලිකිරීමට කටයුතු කිරීම සහ ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කොට විශාල කතිකාවතක් දේශීයව මෙන්ම විදේශීයව ඇති කිරීමට පුරෝගාමී වීම.
- හමුදා කඳවුරක් සෑදීම සඳහා පානම ප්‍රදේශයේ ගැමියන්ට අයත් සහ පෞරාණික විහාරස්ථාන කිහිපයක ඉඩම් මෙන්ම වනාන්තර ඉඩම් අක්කර 1500 කට ආසන්න ප්‍රමාණයක් අත්පත් කරගත් අතර ඉන් විශාල වනාන්තර විනාශයක් මෙන්ම සමාජීය ගැටළු ගණනාවක් හටගන්නා ලදී. අප ආයතනය මැදිහත්වී ප්‍රදේශවාසීන් සහ ආරක්ෂක අංශ සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද අතර අවසානයේ ආරක්ෂක අංශ විසින් මෙම කඳවුර වෙනත් භූමියක් වෙත ගෙනයාමට එකඟ වන ලදී.
- පරෙවි දූපත සමුද්‍ර ජාතික වනෝද්‍යානය තුල කොරල් ආහාරයට ගන්නා ආක්‍රමණශීලී ජීවියෙකු වන කටු ඔටුනු පසැඟිල්ලා (Crown of Throne Starfish) විශාල වශයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන් උද්‍යානයේ කොරල් පර වලට සහ ජෛවවිවිධත්වයට බරපතල තර්ජනයක් විය. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් දැනුවත්කොට අප ආයතනයේ ස්වේච්ඡා ක්‍රියාකාරිකයන් කණ්ඩායමක් විසින් තෝරාගත් ප්‍රදේශයක් තුල එම සතුන් ඉවත්කරන ලදී.
- සංචාරකයන් විසින් අපවිත්‍ර කරන ලද නිලාවැලි වෙරළ තීරය ප්‍රදේශවාසී බෝට්ටුකරුවන් සමඟ පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පවත්වන ලදී. වෙරළ පිරිසිදුභාවයේ වැදගත්කම පිලිබඳව සංචාරකයන් සහ බෝට්ටුකරුවන් දැනුවත්කරන ලදී.
- බෙල්ලන්විල - අත්තිඩිය අභයභූමිය හරහා ඉදිකිරීමට යෙදුනු මාර්ගය සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත්කර, වහාම නැවැත්වීමට කටයුතු කිරීම.

- කඳපොල සීතාඑළිය ප්‍රදේශයේ වනාන්තර භූමියක් තුල සිදුකිරීමට නියමිතව තිබූ සන්නිවේදන කුළුණු ව්‍යාපෘතිය අත්හිටුවීම.
- ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස දියත්කිරීමට සූදානම් වූ කොතල හිඹුටු අපනයනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාල ආයතන වලට විරෝධතාවය පළකර ජනතාව දැනුවත් කිරීම සිදුකල අතර මේ වන විට එම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා ඇත.
- මාදුරු ඔය ජාතික වනෝද්‍යානයට නීතිවිරෝධී ලෙස ගවයන් ඇතුළු කිරීමෙන් ඇතිවන ගැටළු සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත්කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එලෙස වනෝද්‍යානය තුලට ගවයන් ඇතුළු කළ තැනැත්තන් රැසක් අත්අඩංගුවට ගෙන ඇත.
- කුඩා දරුවන්ගේ මොළයේ වර්ධනයට හානිකර TBHQ නැමැති ප්‍රතිඔක්සිකාරකය අන්තර්ගතවීම හේතුවෙන් "ඇස්ට්‍රා මේද තැවරුම" දැවටුමෙහි "අවුරුදු 03 ට අඩු දරුවන්ට නුසුදුසුය" ලෙස සටහන් කිරීමට 2011 වසරේ කහටගස්දිගිලිය මහේස්ත්‍රාත් උසාවිය මඟින් ඇස්ට්‍රා නිෂ්පාදන සමාගමට නියෝග කළ අතර එය ඉටුකිරීම සඳහා වසරක කාලයක් ලබාදෙන ලදී. නමුත් වසර දෙකක කාලයක් ගතවූවද එම නියෝගය ක්‍රියාත්මක නොවුනු අතර අප ආයතනය මඟින් ප්‍රධාන ආහාර බලධරයා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කළ අතර මසක් ඇතුලත එම සමාගම විසින් ඇස්ට්‍රා මේද තැවරුම නිෂ්පාදනය සඳහා ඉහත ප්‍රතිඔක්සිකාරකය භාවිතා කිරීම අත්හිටුවන ලදී.
- නුවරඑළිය බෝඹුරු ඇල්ල රක්ෂිතය මායිමේ එම රක්ෂිතයට හානි වන පරිදි එළවළු සේදීමේ කටයුතු යම් පිරිසක් විසින් නැවතත් ආරම්භ කළ අතර අප ආයතනය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් අනතුරුව එම ස්ථානයේ දොල පහර අවහිර කිරීමෙන් සාදා තිබූ අනවසර ටැංකි සියල්ල ඉවත් කළ අතර එම ස්ථානයේ එළවළු සේදීමෙන් වළකින ලෙස දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරන ලදී.
- "ගුරුගේ නේචර් පාර්ක්" උද්‍යානය තුල නීතිවිරෝධී ලෙස පවත්වාගෙන ගිය සත්වෝද්‍යානය සහ එහි සතුන්ට සිදුවන හිරිහැර සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිළධාරීන් දීර්ඝ ලෙස සිදුකල දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රහසිගත මෙහෙයුමක් මඟින් එම ස්ථානය වටළා එහි සිරකර සිටි සත්වයින් රැසක් මුදාගත් අතර එහි කළමනාකාරවරයා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කටයුතු කරන ලදී.
- හීලෑ අලි සම්බන්ධයෙන් පැන නැඟුනු ගැටළු වලට අවස්ථා කිහිපයකදී මැදිහත්වන ලදී.
- ඉන්දියාවෙහි ඉදිකරමින් පවතින කූන්ඩම්කුලම් න්‍යෂ්ඨික බලාගාරය හේතුවෙන් ශ්‍රී ලංකාවට වන බලපෑම සම්බන්ධයෙන් අදාල රාජ්‍ය ආයතන මෙන්ම ජනතාව දැනුවත්කිරීම සිදුකරන ලදී.
- දිවයින පුරා හටගන්නා කැළෑ ගිනි මැඩපැවැත්වීම වෙනුවෙන් ක්‍රියාකල අතර ඒ සම්බන්ධයෙන් විශාල වශයෙන් ජනතාව දැනුවත් කරන ලදී.
- සිංහරාජ වනාන්තරයේ නැගෙනහිර කොටසේ ජෛවවිවිධත්වයට ඇති තර්ජන සහ එම ප්‍රදේශයේ සංරක්ෂණය සම්බන්ධයෙන් අදාල ආයතන සමඟ සාකච්ඡා වට කිහිපයක් සිදුකරන ලදී.

## දැනුවත් කිරීමේ දේශණ

පසුගිය වසර තුල පාසල් 26ක් කේන්ද්‍රකර ගනිමින් දැනුවත් කිරීමේ දේශණ පවත්වා ඇත.

| පාසලේ නම | අ. කොට්ඨාශය | ළමුන් ගණාන | ගුරුවරු ගණාන |
|---|---|---|---|
| මොරගස්වැව විද්‍යාලය | හබරණ | 50 | 6 |
| ජයන්තිපුර විද්‍යාලය | හබරණ | 30 | 1 |
| කඩවත්ගම ශ්‍රී ශෝභිත විද්‍යාලය | මැදවච්චිය | 85 | 8 |
| පරාක්‍රම විද්‍යාලය | වව්නියාව | 140 | 4 |
| ඇටඹගස්කඩ විද්‍යාලය | වව්නියාව | 65 | 13 |
| කොළොම්බුතුරෙයි විද්‍යාලය | යාපනය | 85 | 6 |
| නල්ලූර් විද්‍යාලය | යාපනය | 100 | 6 |
| ගෝනුහද්දනාව විද්‍යාලය | කැබිතිගොල්ලෑව | 20 | 1 |
| තිත්තගෝනෑව විද්‍යාලය | කැබිතිගොල්ලෑව | 75 | 3 |
| ඇතාවැටුන වැව විද්‍යාලය | කැබිතිගොල්ලෑව | 45 | 8 |
| සම්පත්නුවර විද්‍යාලය | කැබිතිගොල්ලෑව | 76 | 3 |
| අලිවංගුව මහ විද්‍යාලය | පදවි ශ්‍රී පුර | 21 | 1 |
| යාය 11/12 විද්‍යාලය | පදවි ශ්‍රී පුර | 25 | 1 |
| යාය 78 විද්‍යාලය | පදවි ශ්‍රී පුර | 25 | 1 |
| පදවි ජයන්ති විද්‍යාලය | පදවි ශ්‍රී පුර | 140 | 8 |
| ර/ගෝනකුඹුර මහ විදුහල | පැල්මඩුල්ල | 62 | 3 |
| හ/රන්මුදුවැව මහ විදුහල | සූරියවැව | 53 | 3 |
| හ/කෙත්සිරිගම කණිටු විදුහල | කෙත්සිරිගම | 74 | 2 |
| හ/බෙරලිහෙල මහ විදුහල | ලුණුගම්වෙහෙර | 95 | 6 |
| හ/මැදවැලෑන මහ විදුහල | තිස්ස | 90 | 2 |
| හ/රොටවල කණිටු විදුහල | හම්බන්තොට | 51 | 4 |
| හ/අම්බලන්තොට මහ විදුහල | අම්බලන්තොට | 240 | 8 |
| හ/නිල්වලා ආනන්ද විදුහල | අම්බලන්තොට | 67 | 1 |
| හ/කිවුල කණිටු විදුහල | අම්බලන්තොට | 111 | 3 |
| ශා. ජෝශප් බාළිකා විදුහල | පිළියන්දල | 1,000 | 50 |

2012 වසරේ දිස්ත්‍රික්ක 05ක පාසල් 05ක් තුළ දැනුවත් කිරීමේ දේශණ පවත්වන ලදී.

| පාසලේ නම | අ. කොට්ඨාශය | ළමුන් ගණන | ගුරුවරු ගණන |
|---|---|---|---|
| බිංගදෙනිය මහ විද්‍යාලය | පුත්තලම | 138 | 5 |
| කඩවත්ගම ශ්‍රී සෝභිත විද්‍යාලය | අනුරාධපුර | 122 | 4 |
| ඇටඹගස්කඩ විද්‍යාලය | වව්නියාව | 74 | 2 |
| ර/ ගෝණකුඹුර මහා විද්‍යාලය | රත්නපුර | 106 | 5 |
| පෙන්ටර් මහා විද්‍යාලය | නුවරඑළිය | 61 | 4 |
| | එකතුව | 427 | 20 |
| | මුළු එකතුව | 450 | |

**නීතිමය ක්‍රියාමාර්ග**

අප රටෙහි පාලනය විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන කොටස් තුන මඟින් සිදු කරනු ලබන අතර පරිසර සංරක්ෂණයට ද එම ත්‍රිත්වය දැඩිව බලපානු ලබයි. විධායකය හා ව්‍යවස්ථාදායක ක්‍රියාවලින් අසාධාරණයට ලක්වන පුරවැසියන් යුක්තිය පැතිය හැකි එකම ස්ථානය වන්නේ අධිකරණයයි.

පරිසර සංරක්ෂණයට සැබෑ ලෙසම කැපවූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නීතිය ඉදිරියේ පෙනී සිටිමින් නීතියේ යහපාලනය සුරක්ෂිත කිරීමට සවියක් වීම ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ නීති අංශයේ මුඛ්‍ය පරමාර්ථයයි. එකී පරමාර්ථය මුදුන්පත් කරලීමට ජනතාවට සිදුවන පරිසර අසාධාරණයන්හීදී නීති උපදෙස් ලබාදීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සහ රාජ්‍ය මට්ටමේ සිදුවන අණ පනත් හා නීති රෙගුලාසි සංශෝධනයන් හීදී දායක වීම ආදී වැඩසටහන් රැසක් මෙහෙයවනු ලැබේ.

**ක්‍රියාවට නංවන ලද උපාය මාර්ග**

- නීති ආධාර ලබාදීම - උපදෙස් ලබාදීම.
- අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම.
- නීති, අණ පනත් සංශෝධනයට දායකවීම.
- ක්ෂේත්‍රයේ (නීති හා පාරිසරික) නියුක්තිකයන් සමඟ අන්තර් සබඳතා පැවැත්වීම.

**නීතිමය මැදිහත්වීම්**

කෝකිළායි කළපුව ආශ්‍රිත හැඹලවැව ප්‍රදේශයේ රාජ්‍ය දැව සංස්ථාව විසින් නීති විරෝධී ලෙස දැව හෙළීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි අංක 567/2010 යටතේ ගොනුකල නඩුව අවසන් කරමින් විත්තිකාර පාර්ශවයන් සඳහා තරයේ අවවාදකර එම ව්‍යාපෘතිය වහාම නවතා දමන ලෙස තීන්දුව ලබා දෙනු ලැබීය. මෙම නඩු තීන්දුව මේවන විට පූර්වාදර්ශ නඩු තීන්දුවක් ලෙස භාවිතයට ගනු ලැබේ.

- දැදුරු ඔය නීතිවිරෝධී වැළි කැණීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනුකොට තිබූ අංක 226/6 දරණ නඩුව අදාල ආයතන සඳහා නියෝග කිහිපයක් ලබා දෙමින් නිමාවට පත්විය.

සිංහරාජ රක්ෂිතය හරහා විශාල පරිසර හානියකට ඉඩ සලසමින් ඉදිකිරීමට යෙදුනු ඉළුඹකන්ද-සූරියකන්ද මාර්ගයෙහි කටයුතු වළකාලීම සඳහා රත්නපුර දිසා අධිකරණයෙහි අංක 26444/SPL යටතේ නඩුවක් පවරන ලදුව මාර්ගය සෑදීමට එරෙහිව අතුරු තහනම් නියෝගයක් ලබා ගන්නා ලදී. විෂයභාර ඇමතිවරයා පිහිටවූ ස්වාධීන විද්වත් කමිටුව මඟින් ලබාදුන් නිගමන මත මාර්ගය ඉදිකිරීම තහනම් කළ පසු මෙම නඩුව ඉවත් කරගන්නා ලදී.

- දැල්තර ප්‍රදේශයේ බොල්ගොඩ ගඟ ගොඩකරමින් ඉදිවූ හෝටල් සහ තවත් අනවසර ගොඩනැගිලි කිහිපයකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනුකල අංක 177/10 දරන නඩුව සඳහා මේවන තුරු තීන්දුවක් ප්‍රකාශයට පත්වී නොමැත.
- සිංහරාජ රක්ෂිතය තුල එයට හානිදායක වන අයුරින් වෙනිවැල් ගැට කැපීම සිදුකල පුද්ගලයන්ට විරුද්ධව අප සාමාජික සංවිධානයක සාමාජිකයින් පිරිසක් විසින් කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය නීති ආධාර දීම.
- රතුගල ආදිවාසී සුසානභූමිය බලහත්කාරයෙන් අල්ලාගැනීම සහ පොල්ලෙබැද්ද ආදිවාසී ජනතාවට අයත් ඉඩම් මහවැලි ව්‍යාපාරයට පවරාගැනීමේ කටයුතු වලදී ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් නීති අධාර ලබාදීම.

**මාධ්‍ය හා ප්‍රකාශන කටයුතු**

"අරණ" ද්විමාසික ප්‍රකාශනය

- 11 කාණ්ඩය 01 කළාපය - වනාන්තර සහ අපි
- 12 කාණ්ඩය 01 කළාපය - සංවර්ධන සංහාරය
- ,, 02 කළාපය - RIO + 20 ට පසු
- ,, 03 කළාපය - පොදු ජල අයිතියට අත නොතබනු!

**පත්‍රිකා**

- පවස නිවන දිය බිඳුව
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- පළිබෝධනාශක භාවිතය
- අපට නැතිවම බැරි උතුම් සම්පත වායුව
- ශ්‍රී ලංකාවේ වනාන්තර සහ ජෛවවිවිධත්වය
- මීලඟ ගොදුර ඔබද? (වකුගඩු රෝග)
- නිහඬ මාරයා - පාම් තෙල්
- කැළෑ ගිනි නොතබනු!
- ආසනික් කෘෂිරසායන

## 3.2 ආහාර ස්වෛරීභාවය හා තිරසර ගොවිකම් පිළිබඳ වැඩසටහන (FSSAP)

නිවස අවට පරිසරයේ තිරසර පැවැත්ම තහවුරු කරමින් ඒ ඔස්සේ නිවැසියන්ගේ එදිනෙදා පෝෂණ අවශ්‍යතාවයන් වස විසෙන් තොරව සපයා ගැනීමටත් සමාජය වෙතින් ගිලිහෙමින් පවත්නා සාම්ප්‍රදායික දැනුම එක්රැස් කරමින් ඒවා ක්‍රියාවට නංවන දැනුම බෙදා හදා ගැනීමත් පසුගිය වර්ෂය පුරාවට ඉටු කරන ලද කාර්යයකි.

තමන්ගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර භෝග වස විසෙන් තොරව සපයා ගැනීමට කණ්ඩායම් මෙහෙයවීම මගින් එකී කණ්ඩායම්වල සාමාජිකත්වය දරන්නන් නිවසේ ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමේ දී වෙළඳපල වෙත ගෙවන මුදල සහ යොදවන කාලය කළමනාකරණය කර ගැනීමට හැකි විය.

ගෙවත්තෙන් ලැබෙන වස විසෙන් තොර ආහාර ද්‍රව්‍ය (එළවළු/ අල වර්ග/ කුළු බඩු/පලා වර්ග/ඖෂධ වර්ග) තම අසල්වාසීන් වෙත අලෙවි කිරීමෙන් අමතර ආදායම් ලැබීමට කණ්ඩායම් සාමාජිකාවන්ට හැකි විය. ආහාර ද්‍රව්‍ය සුලබ කාල වකවානුවේ ඒවා සංරක්ෂණය කර කල්තබා ගැනීම තුලින් ආහාර හිඟ කාලයේ අලෙවියෙන් අමතර ආදායම් ලබා ගැනීම කෙරෙහිත් මෙම වැඩසටහනේ බහුතරයක් සාමාජික සාමාජිකාවන් වෙත ඉඩහසර සලසා දුන් කාලයක් ලෙස පසු ගිය දෙවසර හඳුන්වා දිය හැකිය.



තවද ගම් කුකුළු මෙන්ම මී මැසි පාලනයේ යෙදීම තුළින් නිවසේ පෝෂණ අවශ්‍යතාවය මෙන්ම අමතර ආදායම් මාර්ග ගෘහනියන් වෙත ලඟා කර වීම යනාදී සෘජු ප්‍රතිලාභ රාශියක් මෙම වැඩසටහන විසින් තම කණ්ඩායම් සාමාජිකත්වය වෙත පිරිනමා ඇත. මෙම සෘජු ප්‍රතිලාභීන් විසින් නිෂ්පාදනය කරනු ලබන අතිරික්තය පරිභෝජනය සඳහා අනෙකුත් පිරිස් වෙතද අවස්ථාව ලැබීම මෙහි වක්‍ර ප්‍රතිඵල අතර වේ.

වස විසෙන් තොරව ජීවත් වීමට මෙන්ම ඔවුනගේ දෛනික දිවිය වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ද වැඩසටහන විසින් අත්වැල් සපයන ලද්දේ ආයුර්වේද වෛi සායන පවත්වමින්ය. එමෙන්ම සාම්ප්‍රදායික දැනුම ප්‍රවර්ධනය කෙරෙහි ද වැඩසටහන විසින් ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ඒ අනුව දිගාසිරි ගෙනෙන සොබාදම් අහර යන තේමාව ඔස්සේ ප්‍රදර්ශන පැවැත්වීම ද සිදු කරන ලදී.

වයඹ විශ්ව විද්‍යාලයේ පශු සම්පත් සහ ධීවර පීඨය සමඟ කටයුතු කරමින් දැනුම බෙදා හදා ගැනීමටත් නව පර්යේෂණ සඳහා ක්‍රියාකාරකම් සිදු කිරීමත්, 2011 වර්ෂය ඇතුලත සිදු කරන ලද දේය. එමෙන්ම එම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් දෙදෙනෙකුට ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සපයා දීමද සිදු කෙරින.

දමිළ මාධ්‍ය ප්‍රකාශන සහ නව සොයා ගැනීම් හරහා වැඩසටහනේ ව්‍යාප්තිය වඩ වඩාත් සිදු විය. 2011 වර්ෂයේදී නියමු වැඩසටහන මන්නාරම, වව්නියාව, කිලිනොච්චි සහ යාපන දිස්ත්‍රික්කවල තෝරාගත් කණ්ඩායම් කරාද සිදු කෙරින.

එසේම අත්‍යවශ්‍ය උපකරණ, බීජ හා රෝපන ද්‍රව්‍ය මෙන්ම දමිල මාධ්‍ය ප්‍රකාශන ද ලබා දීම සිදු විය.

### උපාය මාර්ග

- දැනුවත් කිරීම
- පහසුකම් සලසා දීම
- ප්‍රජාව මෙහෙයවීම
- ප්‍රකාශන
- අත්හදා බැලීම්/නව සොයා ගැනීම්
- ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය අංශයේ විවිධ කමිටු සාමාජිකත්වය දැරීම

### අමතර ආදායම් ඇති කිරීම
### ආහාර විජලන යන්ත්‍ර ලබා දීම

ආහාර සුලබ කාලයන් තුළ විශේෂයෙන් කොස්, දෙල් වැනි ආහාර විජලනය කර එම ආහාර දුලබ කාලයේදී ප්‍රයෝජනයට ගැනීම මගින් වියදම් අවම කොට ආදායම් උත්පාදනය කිරීමට කණ්ඩායම් පුහුණු කරන ලදී. ඒ අනුව නව විජලන යන්ත්‍රයක් ගාල්ල පනුගල්ගොඩ කණ්ඩායම වෙතද ලබා දෙන ලදී.

කණ්ඩායම් අතර දැනුම, අධ්‍යාපනය සහ තාක්ෂණය හුවමාරු කර ගැනීම සඳහා පුවත් හසුන මුද්‍රණය කොට එළි දක්වන ලදී. එසේම 2011 වසරේදී ගාල්ල පනුගල්ගොඩ දී දිගාසිරි ගෙනෙන සොබාදම් අහර යන තේමාව මූලික කර ගනිමින් ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

2005 වසරේ සිට මෙතෙක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් මත වවන සහ වැවෙන ආහාර අපතේ යන ඉහළ ප්‍රතිශතයෙන් යම් ප්‍රමාණයකට හෝ අගය එකතු කළ නිෂ්පාදන ලෙස නිපදවා වෙළඳපොලට යොමු කළ හැකි නම් එය වැඩසටහනට සම්බන්ධ කාන්තාවන්ගේ ආදායම තවදුරටත් නංවාලීමට යොදාගත හැකි බවට ලබාගත් පුලුල් අවබෝධයකි.

ආහාර තාක්ෂණය පිළිබඳව නව අත්හදා බැලීම් රැසක් සිදු කළ අතර එමගින් මෙතෙක් පැවැති තාක්ෂණයෙන් ඔබ්බට ගිය ආහාර නිපැයුම් කිහිපයක් එළිදැක්වීමේ හැකියාව 2012 වසරේ දී ලැබීන. එම අත්හදා බැලීම් මත කොස් සහ දෙල් කැරලි, ක්ෂනික සියඹලා සහ දිවුල් ආහාර පාන නිපැයුම, විශේෂිත කොළ කැඳ, තක්කාලි පිටි, මතස්‍ය ආශ්‍රිත නිෂ්පාදන ආදී නැපැයුම් රැසක් වෙළඳපල සඳහා සකස් කළ අතර ඒ අතුරින් සියඹලා පිටි නිෂ්පාදනය සහසක් නිපැයුම් 2012 සම්මාන උළෙලේදී සම්මානයක් දිනාගැනීමටද සමත්විය.

ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී කැන්ඩි සිටි සෙන්ටර් සහ BMICH හිදී ඉහත ආහාරමය නිෂ්පාදන වෙළඳපලකරණය සඳහා විවිධ ප්‍රදර්ශන පැවැත්වූ අතර ජාතික පුවත්පත් කීපයක් මගින් ඒ සඳහා පුලුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී.

එසේම කාර්මික තාක්ෂණ ඒකකය හා ගන්නෝරුව ආහාර තාක්ෂණ ඒකකය විද්‍යානුකූල පර්යේෂණ උපදෙස් ලබාදෙන ලදී. 2012 වසරේදී ප්‍රාදේශීය මධ්‍යස්ථාන 2ක් ආරම්භකළ අතර එකී මධ්‍යස්ථාන මධ්‍යම පළාතේ ගම්පොල ආසන්නයේ ද, අනෙක දකුණු පලාතේ අම්බලන්තොට නගරය ආසන්නයේ ද පිහිටා ඇති අතර ගම්පොල පන්විලතැන්න කාසල් මිල්ක් පිහිටි මධ්‍යස්ථානය දරුවන්ගේ සහ ගොවියන්ගේ ගොවිතැන සහ ආහාර තාක්ෂණය පිළිබඳව මූලික දැනුම ලබා දීම සඳහා මේ වන ක්‍රියාත්මකව පවතී.

2012 වසරේ දී ගන්නෝරුව ආහාර තාක්ෂණ ඒකකයේ දී ඇඹිලිපිටිය කැතිරිච් ආයතනයේ සහ කාසල් මිල්ක් මධ්‍යස්ථානයේ දී තෝරාගත් කණ්ඩායම් කිහිපයකට ආහාර තාක්ෂණවේදය පිළිබඳව පුහුණුව ලබාදුන් අතර කාන්තාවන් 400 ක් සඳහා මූලික උපකරණ කට්ටල බෙදා දීම එහිදී සිදු කරන ලදී.

### 3.3 යහ පාලනය හා ඒකාබද්ධ වැඩසටහන (PCADE)

රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි වග විභාගයකින් තොරව නියමිත නීතිමය පටිපාටීන්ගෙන් බැහැර ව සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් නිසි මගට යොමු කිරීම හෝ එමගින් හානියට පත් ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් මෙම වැඩසටහනට මැදිහත් වීම පසුගිය දෙවසර පුරා සිදු විය. විශේෂයෙන් සමහර පුද්ගලයින් දේශපාලන බල පුළුවන්කාරකම් මත පදනම් වී විවිධ ව්‍යාපෘතීන් රක්ෂිත ප්‍රදේශ වල ක්‍රියාත්මක කරන්නට උත්සාහ දැරූ අවස්ථා වලදී අප ඊට මැදිහත් විය. විශේයෙන් මෙම ව්‍යාපෘති හේතුවෙන් සමහර පිරිස් වලට ඉඩම් අහිමි වීමේ තත්ත්වයක් ඇති විය හැකි බවට අපට පෙනී ගිය අතර ඒ සඳහා එම පිරිස් සන්නද්ධ කිරීම හා පාරිසරික සුරක්ෂිත භාවය උදෙසා අප ක්‍රියාත්මක විය.

එසේම 2009 මැයි මස රටේ පැවති ගැටුම්කාරී වාතාවරණය අවසාන වීමත් සමඟ සංවර්ධන ක්‍රියාකාරකම්වල සීඝ්‍ර පිබිදීමක් උතුරු, නැගෙනහිර, උතුරු මැද හා වයඹ පළාත්වල දක්නට ඇත. මේ සංවර්ධන ක්‍රියාකාරකම් මාර්ග සංවර්ධනය, වාරිමාර්ග, විදුලිබල උත්පාදනය හා ජල පහසුකම් සැපයීම වැනි පුළුල් පරාසයක පැතිර ඇත. කෙසේ වෙතත් මේ බොහෝ ව්‍යාපෘතිවල දැකිය හැකි වැදගත් කරුණක් වන්නේ පරිසර පද්ධති හා එම ප්‍රදේශවල වෙසෙන ප්‍රජා කණ්ඩායම්වල අවශ්‍යතා නොසලකා හැර තිබීමයි.

ප්‍රධාන වශයෙන් සංවර්ධන ක්‍රියාකාරකම්වල වගකීම පැවරී ඇති ආයතන පරිසර සංරක්ෂණය හා ඒ ආශ්‍රිත නෛතික කරුණු කෙරෙහි උනන්දුවක් නොදැක්වීම කණගාටුදායක තත්ත්වයකි. එම ආයතන ඉහළ ධාරිතාවයකින් යුක්ත නොවීම හෝ දේශපාලන බලයට යටත් වීමට සිදු වීම හේතුවන බව අපගේ හැඟීමයි. මේ තත්ත්වය දැනට සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියකාරකම්වල උපරිම ප්‍රතිඵල ලබාගැනීමට බාධාවක් විය හැකි අතර නොයෙක් පාරිසරික හා සමාජයීය ගැටලු ඇති කිරීමටද හේතුවිය හැකිය.

අප වැඩසටහන, 2011 හා 2012 වසර තුළ සීඝ්‍රයෙන් වැඩි වන සංවර්ධන ව්‍යාපෘතීන් මගින් පරිසරයට හා පොදු මහජනයාට සිදුවන බලපෑම අවම කර ගත හැකි ආකාර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. විශේෂයෙන් සංචාරක ව්‍යාපෘති සඳහා රක්ෂිත හා කැළෑ පෙදෙස් එළි පෙහෙලි කිරීම නිසා සිදුවන වන හානිය අවම කිරීමට අවශ්‍ය උපක්‍රමික ක්‍රියා මාර්ග අප ව්‍යාපාරය විසින් ගන්නා ලදී. මේ සඳහා අපගේ මැදිහත්වීම තුන් ආකාරයකින් සිදු වුනි. බිම් මට්ටමේ කණ්ඩායම් සංවිධානය කිරීමසේම රාජ්‍ය මට්ටමේ නිළධාරීන් දැනුවත් කර අපගේ සබඳතා භාවිතා කොට යම් යම් හානීන් වළක්වා ගැනීම යන දෙයාකාරය හා මේ දෙයාකාරයෙන්ම සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගත නොහැකි යැයි හැඟී ගිය අවස්ථා වල අප නීතිමය ක්‍රියා මාර්ග වලට පෙළඹුනු අතර, පවතින සෘණාත්මක පරිසරය මධ්‍යයේ වුවද අප හට සාධනීය නීතිමය ජයග්‍රහන අත්පත් කර ගැනීමට හැකි විය. විශේෂයෙන්ම සිංහරාජ, මෝර්නින්සයිඩ් මායිම් කොට ඉළුඹකන්ද ගම්මානයට පාරක් කැපීම සඳහා යෝජනා වූ අවස්ථාවේ යහ පාලනය හා ඒකාබද්ධ වැඩසටහන, ස්වාභාවික සම්පත් කළමනාකරන වැඩසටහන හා එක්ව ඉතිරිව තිබූ අවසාන ක්‍රමවේදය වන නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට ක්‍රියා කළ අතර එමගින් එම හානිය වළක්වා ගැනීමට හැකි විය.

ව්‍යාපාරයේ කලාපීය සංවිධානයක් වන, ජාත්‍යන්තර මට්ටමේ දී සංවර්ධන ඵලදායිතාව පිළිබඳව ක්‍රියාත්මක වන 'Reality of Aid network' හි වාර්ෂික සමුළුව අපගේ සංවිධායකත්වයෙන් 2011 ජනවාරි 11 දින කොළඹ, රේණුකා හොටලයේ දී පැවැත්විනි. මේ සඳහා ලෝකයේ සියළුම කළාප ආවරනය වන පරිදි සාමාජික සංවිධාන නියොජිතයින් සහභාගී වූහ. ආධාර ඵලදායීතාව පිළිබඳ ඉස්තාම්බුල් ප්‍රතිපත්ති පිළිබඳ ආචාරිනී අස්රා සයීඩ් ගේ දේශනයකින් සමුළුව ආරම්භ වූ අතර, දැනට ආධාර ඵලදායීතාව පිළිබඳ සිදු කෙරෙන කථිකාවතේ ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් හා බූසාන් ඉහළ මට්ටමේ සැසිවාරය ඉලක්ක කොට 'Reality of Aid Network' ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ඉදිරි සැළසුම් කිරීම ද මෙහි දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන ලදි. මේ සඳහා ලෝකය පුරා පැතිර පවතින සංවිධාන විශාල ප්‍රමාණයක් මෙන්ම ශ්‍රී ලංකාව තුළ

ක්‍රියාත්මක ආධාර ඵලදායීතාව පිළිබඳ කටයුතු කරන ආයතනද සහභාගී විය. මෙම ජාලය හා එක්ව අප වැඩසටහන 2011 හා 2012 දෙවසර පුරා ජාත්‍යන්තර තලයේ දී ආධාර ඵලදායීතාව හා සංවර්ධන ඵලදායීතාව පිළිබඳ කථිකාවතට සක්‍රීයව දායක වූහ.

තවදුරටත් යහ පාලනය හා ඒකාබද්ධ වැඩසටහන හා ස්වාභාවික සම්පත් සංරක්ෂණ හා කළමණාකරන වැඩසටහන එක්ව දැනට රජරට පුරා පැතිර පවතින වකුගඩු රෝගයට හේතුකාරක වන කෘමිනාශක භාවිතය අවම කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රනයේ අවධානය යොමු කරලීමට බිම් මට්ටමේ හා ජාතික මට්ටමේ දී වැඩසටහන් රාශියක් සංවිධානය කළේය. මේ පිළිබඳව සක්‍රීයව කටයුතු කරන වෛද්‍ය චන්න ජයසුමන මහතා හා උනන්දුවක් දක්වන විවිධ සංවිධාන පුද්ගලයින් ඒකරාශී කරගෙන පුළුල් පෙරමුණක් ලෙස මෙම වැඩසටහන් දියත් කිරීමට හැකි විය. අපගේ උත්සාහය යම් යම් ජයග්‍රහණ කරා අපව යොමු කිරීමට සමත් වුවද සමස්තයක් ලෙස අප අවසාන ඉලක්කය උදෙසා සිදු කළ යුතු ක්‍රියාකාරකම් බොහොමයක් ඇත. මෙම ගැටළුව හුදෙක් ප්‍රාදේශීය මට්ටමේ ගැටළුවකට සීමා නොකර, ජාතික මට්ටමේ දී රජයේ හා සමස්ත ජනතාවගේ අවධානය යොමු කරලීමට අපගේ උපක්‍රමික ක්‍රියා කලාපය ඉවහල් විය. විශේෂයෙන් මාධ්‍ය තුළින් පළමුව සියළු දෙනාගේ අවධානය මේ දෙස යොමු කරන්නට හැකි වූ අතර ඉන් පසුව පත්‍රිකා බෙදා හැරීම හා පා ගමනක් සංවිධානය තුළින් මෙය ජාතික මට්ටමේ ගැටළුවක් ලෙස සලකා වගකිව යුතු පාර්ශව කටයුතු කරන තැනට වැඩසටහන් මෙහෙයවීමට අපට හැකි විය. මෙය සමස්තයක් ලෙස මේ පිළිබඳව සක්‍රීයව කටයුතු කළ පුද්ගලයින්, හා සංවිධාන වල උත්සාහයේ ප්‍රතිඵලයක් බව අපගේ හැඟීමයි.

## 3.4 දේශගුණික විපර්යාස පිළිබඳ පොදුජන ලේකම් කාර්යාලය 'සිහිල් දියත'

- දේශගුණික විපර්යාස පිළිබඳ පොදු ජන ලේකම් කාර්යාලය 2011 හා 2012 වසර තුල දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික මට්ටමේ කතිකාවතක් ගොඩනැගීමට සහ දේශගුණ විපර්යාස මගින් පීඩාවට පත්වන ජන කොටස් ඉලක්ක කොට විවිධ උපාය මාර්ගික පසුබිම් ඔස්සේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදි.

- විශේෂයෙන්ම ජාතික මට්ටමේ දී දේශගුණික විපර්යාස පිළිබඳ කටයුතු කරන රාජ්‍ය ආයතනය වන දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය මගින් ක්‍රියාවට නංවන ප්‍රතිපත්තිමය වැඩසටහන් සඳහා දේශගුණ විපර්යාස පිළිබඳ පොදු ජන ලේකම් කාර්යාලය විසින් සක්‍රීය දායකත්වය ලබා දෙන ලදී. විශේෂයෙන් දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීම සඳහා හා දේශගුණ විපර්යාස පිළිබඳ අනුගතවීමේ ජාතික උපාය මාර්ගය සැකසීමට දායක විය. දේශගුණ විපර්යාස පිළිබඳ අනුගතවීමේ උපාය මාර්ගික සැලැස්ම සැකසීමේ දී ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය ජෛව විවිධත්වය හා කෘෂිකාර්මික යන ක්ෂේත්‍ර වල ඇති වියහැකි බලපෑම් පිළිබඳව පුළුල්ව අවධාරනය කරන ලදී.

- පසුගිය දෙවසර තුල ක්‍රියාත්මක කරන ලද බිම් මට්ටමේ වැඩසටහන් අතර ආපදා කළමනාකරණ වැඩසටහන්, වෙනස් වන දේශගුණයට ගැලපෙන ලෙස සකසන ගෙවතු පුහුණු වැඩසටහන්, තරුණ තරුණියන් හා පාසල් සිසු සිසුවියන් ඉලක්ක කොට ක්‍රියාත්මක කරන දැනුවත් කිරීම්, පුහුණු වැඩසටහන් හා සඟරා පළ කිරීම යනාදිය දැක්විය හැක.

- මෙම වැඩසටහන් උපාය මාර්ගිකව කොටස් දෙකක් හරහා ක්‍රියාත්මක වේ. ජාතික මට්ටමේ දී ප්‍රතිපත්තිමය කාරනා සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම හා බිම් මට්ටමේ දී දේශගුණ බලපෑමට ලක්වන, අවධානම් කලාප වල සිටින ජනතාව ඉලක්ක කොට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වේ.

- එසේම 2011 වසරේ දී ගැටුම්කාරී වාතාවරනයෙන් මුදවාගත් ප්‍රදේශ වල ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වයන් නගාසිටුවීම සඳහා කටයුතු කළයුතු බවට උපාය මාර්ගික තීරණයක් ගන්නා ලදි.



- ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඔස්සේ හැකිතාක් බලපෑම් අවම කරන තීන්දු තීරණ හා වැඩසටහන් සඳහා රාජ්‍ය අංශය යොමු කිරීමට කටයුතු කිරීම.

- වෙනස්වන දේශගුණය තුළ පාරම්පරික දැනුමේ විද්‍යාත්මක දැනුම යන දෙකේම සංකලනයන් තුලින් බලපෑම් අවම කිරීමට කටයුතු කිරීම.

- දේශගුණ විපර්යාස පිළිබඳ ඇති කලාපීය සංවිධාන හා ජාල සමඟ එක්ව කටයුතු කර ලංකාවට හැකි අවස්ථාවන් පුළුල් කිරීමට කටයුතු කිරීම.

- දේශගුණ විපර්යාස ඇති කිරීම සඳහා අවම දායකත්වයක් දැක් වූ නමුත් අනාගතයේ වැඩිම බලපෑමකට මුහුන දීමට සිදු වන තරුණ තරුණියන් හා පාසල් සිසු සිසුවියන් දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කොට ඔවුන්ගේ දැනුම තුළින් පරිසර හිතවාදී තීරන ගැනීමට දිගුකාලීනව යොමු කිරීම.

- දේශගුණ වෙනස්වීම් මත වැඩිවන ආපදා තත්ත්වයන්ට මුහුන දීම සදහා එම ජනතාව බලගැන්වීම සඳහා ගම් මට්ටමේ ඇති ස්වේච්ඡා ආයතන හා ප්‍රාදේශීය රාජ්‍ය ආයතන ඇතුළත් හිතකර වටපිටාවක් නිර්මාණය කිරීම.

**බිම් මටමමේ දී අත්පත් කරගත් ඉලක්ක**

- 2011 හා 2012 දෙවසර තුල ශ්‍රී ලංකාව පුරා විසිර පවතින පාසල් වල සිසුන් 2,500 ක් පමණ ඉලක්ක කොට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙහි දී ප්‍රමුඛතාව දැක්වූයේ දේශගුණ විපර්යාස පිළිබඳ දැනුම හා අවස්ථා අඩු ග්‍රාමීය පාසල්ය. එසේම පාසල් ළමුන්ගේ කවි, නිර්මාණ එළි දැක්වීම සඳහා අප ආයතනය විසින් ''සිහිල් දියත'' නමින් සඟරාවක් එළි දක්වන ලදි.

- දේශගුණ විපර්යාස පිළිබඳ දැනුමැති තරුණ, තරුණියන් බිහි කිරීමේ අරමුණැතිව දේශගුණ විපර්යාස හා බැඳි සමාජ ආර්ථික හා සංස්කෘතික බලපෑම පිළිබඳව නේවාසික පුහුනු වැඩමුළුවක් 2012 ජුනි 25 හා 26 දෙදින පුරා බොරලැස්ගමුව, Help Age මධ්‍යස්ථානයේ දී පැවැත්වීය. මේ සඳහා 35ක පිරිසක් සහභාගී වූ අතර සහභාගී වූවන් බොහොමයකගේ වැඩසටහන පිළිබඳ ප්‍රතිචාරය ධනාත්මක විය. සහභාගී වූ පිරිස විශ්ව විද්‍යාල සිසු, සිසුවියන්, පාසල් ළමුන් හා ක්ෂේත්‍රයේ සිටින අය විය.

- අම්බාල්කුලම් ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධානම ගැටළුවක්ව පැවැති පානීය හා කෘෂිකාර්මික ජල අවශ්‍යතාවයන් සැපිරීම සඳහා ප්‍රදේශයේ වගා ළිං 30ක් හරිත ව්‍යාපාරයේ මැදිහත්වීම හා ගම්වාසීන්ගේ දායකත්වය මත ප්‍රතිසංස්කරණය කරන ලදි. මෙය ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීමට හා අප විසින් ක්‍රියාත්මක කළ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමේ වැඩසටහනට සාධනීය දායකත්වයක් සැපයීය.

- කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, අම්බාල්කුලම් ග්‍රාමනිළධාරී වසමේ නැවත පදිංචි කළ පවුල් 60කගේ කෘෂිකාර්මික ජීවනෝපාය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කෘෂි උපකරණ හා ඉරිඟු, කව්පි, හා මුං බීජ ලබා දීම සිදු කරන ලදි. මේ යටතේ ඔවුන් බීජ සංරක්ෂණය හා හුවමාරුව සඳහාද යොමු කරන ලදි. මේ වැඩසටහන යටතේ අක්කර 60කට ආසන්න ප්‍රමානයක් වගා කිරීමට අප මැදිහත්වීම දායකත්වයක් සැපයීය.




- කළුතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර හා මුදලන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වල ගම්මාන හතරක ආපදා කළමනාකරණ සැළසුම් සකස් කොට, ගම්මාන තුළ ආපදා කළමනාකරණ සමිති පිහිටුවා ප්‍රජාව ශක්තිමත් කොට ඔවුනට ගංවතුර අවශ්‍යතාවයේ දී භාවිතයට අවශ්‍ය ඔරු, ටෙන්ට්, බෙහෙත් කට්ටල, ඉවුම් පිහුම් උපකරන, ජීවිතාරක්ෂක කබා ආදිය ලබා දෙන ලදි. මෙම උපකරණ 2012 හා 2013 වසර තුල ඇතිවූ සුළු ගංවතුර තත්ත්වයන් වලදී ගම්වාසීන් විසින් ප්‍රයෝජනයට ගත් අතර මෙම සමිති ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයෙන් මැදිහත් වීමකින් තොරව මේ වන විට එම ගම් තුළ ක්‍රියාත්මක වෙමින් තිබේ. අප ආයතනය විසින් මෙම කටයුතු අධීක්ෂණ කාර්ය පමණක් සිදු කරනු ලබයි. එසේම පාලින්දනුවර ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ පීල්ලවලකඩ ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාව ඉටු කිරීම සඳහා පවුල් 14ක් වෙනුවෙන් පොදු ළිඳක් ඉදි කරන ලදි.

- වෙනස් වන දේශගුණ තත්ත්වයනට ගැලපෙන ලෙස ගෙවතු වගාව සිදු කරන්නේ කෙසේද? යන්න අත්හදා බැලීමේ වැඩසටහනක් අප විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වැටිය ග්‍රාම නිළධාරී වසම තුළ පවුල් 75 ක් සමඟ ක්‍රියාත්මක කරන ලදී. මූලිකව දැනුවත් කිරීම් සිදු කර වැඩසටහනට උනන්දුවක් දක්වන පිරිස් එකතු කර ඔවුන්ව පුහුණු කර කන්ඩායම් රැස් කොට අවශ්‍ය උපකරන හා බීජ ලබා දුන් අතර, ඔවුන්ව අධීක්ෂණය කිරීම අප විසින් අඛණ්ඩව සිදු කරනු ලබයි. මෙහිදී සමහර පිරිස් විසින් අප වැඩසටහනේ මගපෙන්වීම මත ගෙවත්ත දියුණු කොට හා පැළ සකස් කර අළෙවි කර මාසිකව රු.5,000.00 ක් පමණ අමතර ආදායමක් ලබා ගන්නා තත්ත්වයට වර්ධනය වී ඇත. මෙම වැඩසටහනේ දෙවන පියවර ආහාර සංරක්ෂණ හා ආදායම් උත්පාදන වැඩසටහනක් 2013 වසරට සැළසුම් කර ඇත. එසේම මෙම වැඩසටහන වැටියට යාබද ග්‍රාම නිළධාරී කොට්ඨාශය වන ඇත්බටුව වසමට 2013 වසරේ ව්‍යාප්ත කරන ලදී.

## 3.5 ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව කළමනාකරණ ව්‍යාපෘතිය (CBM)

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ

| ව්‍යාපෘති ප්‍රදේශය | දිස්ත්‍රික්කය | ප්‍රා:ලේ: කොට්ඨාශ/ය | ග්‍රා:නි: වසම/වසම් |
|---|---|---|---|
| ඇතුන්ගොඩ | පුත්තලම | ආනමඩුව, කළුවරගස්වැව | ඇතුන්ගොඩ, |
| උළුක්කුලම | අනුරාධපුර | මධ්‍යම නුවරගම් පලාත, මහවිලච්චිය | උළුක්කුලම, බෝගොඩ |
| කන්තලේ | ත්‍රිකුණාමළය | කන්තලේ | රජ ඇල ඒකක 03 සහ 04 |
| කොත්මලේ | නුවරඑළිය | කොත්මලේ | නුගවෙල, කිතුල්බැද්ද |
| වැල්ලවාය | මොණරාගල | වැල්ලවාය, ලුණුගම්වෙහෙර | කුරුගම, පඩිකැපුහෙල |

### ගෙවතු වගාව ව්‍යාප්තිය සහ ආදර්ශ ගෙවතු වගා

- ව්‍යාපෘතියේ ඍජු සහ වක්‍ර ප්‍රතිලාභී පවුල් ඒකක විසින් වර්ෂය පුරා ප්‍රතිලාභ ලබාග න්න ගෙවතු වගාවන් නඩත්තු කරන අතර ගෙවතු වගාව පිලිබඳව ප්‍රජාවගේ දැණුවත්භාවය, කුසලතා සහ ආකල්ප සංවර්ධනය සඳහා එක් එක් ප්‍රජා කණ්ඩායමක් විසින් ආදර්ශ ගෙවතු කිහිපයක් පවත්වාගෙන යාම සිදුකරයි. මෙමගින් ප්‍රතිලාභී ප්‍රජා කණ්ඩායම්වල දෛනික එළවළු, පලතුරු, කුළුබඩු සහ දේශීය ඖෂධ වර්ග සපයාග ැනීමේදි වෙළඳපල මත යැපීම අවම කරගැනීමට අවස්ථාව සැලසී ඇත. එසේම මෙම ගෙවතු වගාවන් සඳහා කෘෂිරසායන ද්‍රව්‍ය සහ රසායනික පොහොර භාවිතය අවම/භාවිත නොකරන නිසා සෞඛ්‍යාරක්ෂිත නැවුම් එළවළු, පලතුරු ආදිය පරිබෝජනය කිරීමට හැකියාව ලැබී ඇති අතරම අතිරේක ආදායමක් උපයා ගැනීමේ අවස්ථාවද උදව් ඇත.

### ප්‍රජා බීජ බැංකු පිහිටුවීම සහ සංවර්ධනය කිරීම

- 2012 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති ප්‍රදේශ පහම ආවරණය වන ලෙස ප්‍රජා බීජ බැංකු පිහිටුවීම සිදුකර ඇති අතර ඒවා සියල්ලක්ම ප්‍රජාව තුල බීජ සංසරණය සහ හුවමාරුව සක්‍රියව සිදුකිරීමට දායක වී ඇත. මෙමඟින් ප්‍රතිලාභී කෘෂිකාර්මික ප්‍රජාවන්ගේ බෝග වගාවන් සඳහා අවශ්‍ය වන බීජ වර්ග එම ප්‍රජාවන් තුලදීම නිෂ්පාදනය කරගැනීමටත් එකිනෙකා අතර බීජ හුවමාරු කරගැනීමටත් අවස්ථාව සැලසී ඇත. ප්‍රජා බීජ බැංකුව ප්‍රජාවට අයත් බීජ ගබඩාවක් ලෙස ක්‍රියාත්මක වන නිසා එහි නඩත්තු කටයුතු ප්‍රජාව විසින්ම සිදුකරන අතර එය ප්‍රජාවගේ සහජීවනය සහ සහයෝගය වර්ධනය වීමටද ඉවහල් වී ඇත.

### සහභාගීත්ව ශාක අභිජනනය- වී සඳහා

- සහභාගීත්ව ශාක අභිජනන ක්‍රියාවලිය වී අභිජනන කටයුතු වලට යොදා ගැනීම හරහා ඇතුන්ගොඩ, උළුක්කුලම සහ කන්තලේ ව්‍යාපෘති ප්‍රදේශවල වී ගොවීන්හට එම එක් එක් ප්‍රදේශයක පවතින පාරිසරික සහ පාංශු තත්වයන්ට ගැලපෙන ලෙස වී වර්ග තෝරා ගැනීමට සහ නව වී වර්ග නිෂ්පාදනය කරගැනීමට යොමු කිරීම සිදුකරමින් පවතී. මේ වන විට ප්‍රජාව විසින් තෝරාගන්නා ලද විවිධ ලක්ෂණ සහිත වී වර්ග ගණනාවක් ඔවුන්ගේ කුඹුරුවල වගා කරමින් වඩාත් යෝග්‍ය වී වර්ග තෝරාගැනීමේ කටයුතුවල නියැලී සිටී.



### ප්‍රජා පාදක ජෛව විවිධත්ව සංරක්ෂණ අරමුදල

- ප්‍රතිලාභි ප්‍රජා කණ්ඩායම් විසින්ම පවත්වාගෙන යනු ලබන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනක් වන ප්‍රජා පාදක ජෛවවිවිධත්ව සංරක්ෂණ අරමුදල මඟින් ප්‍රජාව තුල සිටින අවම ආර්ථික හැකියාවක් සහිත ගොවි ගෙවිළියන් හට සංරක්ෂිත කෘෂිකාර්මික කටයුතු සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම සිදුකරයි. මෙමඟින් සරල ක්‍රමවේදයක් හරහා කෘෂිකාර්මික කටයුතුවලට මූල්‍යාධාර ලබා ගැනීමට ප්‍රජා කණ්ඩායම් වලට හැකියාව පවතින අතර එක් එක් ප්‍රදේශයේ ඇති අවධානමට ලක් වූ කෘෂි බෝග විවිධත්වය සංරක්ෂණයට සහ ව්‍යාප්ත කිරීමට අවස්ථාව සැලසී ඇත.

### ජෛවවිවිධත්ව කොටු සහ ක්ෂේත්‍ර ජාන බැංකු

- ජෛවවිවිධත්ව කොටු සහ ක්ෂේත්‍ර ජාන බැංකු පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම හරහා ව්‍යාපෘති ප්‍රදේශවල එක් එක් බෝග විශේෂයක් තුල පවතින ප්‍රභේද විවිධත්වය සහ බෝග කාණ්ඩ තුල (බෝග ශාක පවුල්) පවතින විවිධත්වය හඳුනා ගැනීමට ප්‍රජා කණ්ඩායම් වලට අවස්ථාව සැලසී ඇත. මෙලෙස බෝග විවිධත්වය සහ එක් එක් ප්‍රභේදයන්හි පවතින විශේෂිත ලක්ෂණ හඳුනා ගැනීමට අවස්ථාව සැලසීම හරහා පාංශු, පාරිසරික වෙනස්කම් සහ රෝග පළිබෝධ බලපෑම අනුව සුදුසු බෝග ප්‍රභේධ/කාණ්ඩ තෝරා ගැනීමට ප්‍රතිලාභී ප්‍රජාවන් යොමුකිරීම සිදුකරයි.

### අවභාවිත බෝග සඳහා අගය එකතු කිරීම

- මෙම ක්‍රියාකාරකම් හරහා අස්වනු වාරයේදි විශාල ප්‍රමාණයන්ගෙන් නාස්ති වන දිවුල්, සියඹලා, අඹ, දෙහි වැනි බහු වාර්ෂික කන්න බෝගවලට සරල අගය එකතු කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම සිදු කරන ලදී. මෙමඟින් එම බෝග වල පසු අස්වනු හානි අඩු කිරීමට කටයුතු සැලසෙන අතරම ප්‍රතිලාභි ප්‍රජාවන් හට අතිරේක ආදායම් මාර්ග

නිර්මාණය කිරීමද සිදුවේ. එසේම ගම්මිරිස් වැනි කුළුබඩු බෝගවලට අගය එකතු කිරීම හරහා එම බෝග නිෂ්පාදන වලට ඉහළ වෙළඳපල වටිනාකමක් ලබා ගත හැකි අතර කොත්මලේ ප්‍රදේශයේ ප්‍රජා කණ්ඩායම මේ සඳහා සුදානම් වෙමින් සිටි.

**ඉහත ක්‍රියාකාරකම්/ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පහත ක්‍රමවේද සහ උපායමාර්ග යොදාගන්නා ලදි.**

- ක්ෂේත්‍ර පුහුණු සහ ආයතන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
- ක්ෂේත්‍ර ආදර්ශණ සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා ප්‍රජා කණ්ඩායම් යොමු කිරීම
- මූලික අරමුදල් සම්පාදනය කර දීම
- විවිධ ආයතන සහ පාර්ශවයන් සමඟ සම්බන්ධතා ගොඩ නැගීම සහ ඒවා ශක්තිමත් කිරීමට කටයුතු කිරීම
- අඛණ්ඩව පසු විපරම් සිදු කිරීම
- ප්‍රජා සංවිධානවල ධාරිතා සංවර්ධනය

**2012 වර්ෂයේ පැවැත්වූ විදේශ පුහුණු, වැඩමුළු, සමුළු සහ වාර්ෂික රැස්වීම්**

දේශීය පශු සම්පත් සංරක්ෂණය සහ තිරසර ලෙස යොදාගැනීම පිලිබඳව පැවැත්වූ පුහුණු වැඩමුළුව

දිනය : 2012/11/27 - 2012/12/04

ස්ථානය : අන්ත්‍රා (ANTHRA) ආයතනය, සෙකුන්දරාබාද්, හයිද්‍රාබාද්, ඉන්දියාව

මෙම පුහුණු වැඩමුළුවට සහභාගිවීම තුලින් දේශීය සහ පාරම්පරික ගොවිපල සත්ත්ව විශේෂ ඔවුන්ගේ නොයෙකුත් ප්‍රභේද (වර්ග) සංරක්ෂණය සහ තිරසර භාවිතයන් පිලිබඳව වැඩිදුර අවබෝධ කරගැනීමට අවස්ථාව උදා විය, එසේම එම ගොවිපල සතුන්ගේ තිරසර භාවිතයන් සහ ජාන සම්පත් සංරක්ෂණය කර ගැනීමට යොදාගත හැකි ප්‍රජා සහභාගී ක්‍රම උපායයන් සහ ක්‍රියාමාර්ග ගැඹුරින් අවබෝධ කරගැනීමට අවස්ථාව සැලසුනු අතර ක්ෂේත්‍ර චාරිකා තුලින් ඉහත ක්‍රියාමාර්ග සහ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන ආකාරය පිලිබඳව ද අවබෝධ කරගැනීමට අවස්ථාව උදා විය.

**වාර්ෂික සැලසුම් කිරීමේ සහ සමාලෝචන රැස්වීම -2012**

දිනය : 2012/12/05 - 2012/12/11

ස්ථානය : පොක්හාර, නේපාල්

මෙහිදී ප්‍රජා පාදක ජෛවවිවිධත්ව සංරක්ෂණ ව්‍යාපෘතියේ සියළු සාමාජික රටවල (ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය සහ නේපාලය) 2012 වර්ෂය තුල සිදුකරන ලද ක්‍රියාකාරකම් සහ උප වැඩසටහන්වල ප්‍රගතිය සහ ප්‍රතිඵල පිලිබඳව සාකච්ඡා කරන ලදි. එසේම උගත් පාඩම්, පැන නැගුණු ගැටළු වලට ලබාදුන් විසදුම් සහ ඒවායේ ප්‍රතිඵල සකච්ඡාවට භාජනය විය. මෙම වාර්ෂික රැස්වීමේදී 2013 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ සැලසුම් පිලිබඳව සහ ඒවා ක්‍රියාත්මක කිරීමට යොදාගන්නා ක්‍රමෝපායයන් සහ ප්‍රතිඵල වාර්තාකරණය පිලිබඳවද සාකච්ඡා කරන ලදි.

### 3.6 සාගර හා වෙරළ ආශ්‍රිත සම්පත් සංරක්ෂණය හා කළමනාකරණ වැඩසටහන (MCRCM)



2011 වර්ෂයේ සාගර හා වෙරළ ආශ්‍රිත සම්පත් සංරක්ෂණය හා කළමනාකරණ වැඩසටහනේ ප්‍රධාන ඉලක්ක ප්‍රදේශය වූයේ එවකට වඩාත් මානව බලපෑම් තර්ජනයන්ට ලක්ව තිබූ පුත්තලම් කලපු ආශ්‍රිත පරිසර පද්ධතියයි.

කලපු පරිසර පද්ධතියේ තිරසාර පැවැත්මට එරෙහිව ඇති තර්ජන හා අභියෝග හඳුනා ගැනීම සඳහා සියළු පාර්ශව කරුවන්ගේ අදහස් යෝජනා විමසීමක් සිදු කොට තත්ව විශ්ලේෂණ වාර්තාවක් සැකසීම හා එහිදී පැන නැගුණු අභියෝගයට අදාල පාර්ශවයන්ට මුහුණ දීම පහසු කරවන ආකාරයේ ක්‍රියා මාර්ගයන් දිරිගැන්වීම සිදු කරවන ලදි.

මෙහිදී වඩාත් කැපී පෙනෙන කාර්යයක් ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්යාල පහසුකම් හා ක්ෂේත්‍ර කාර්යයන්ට අවශ්‍ය පහසුකම් සැලසීමක් ලෙස,

- කාර්යාල ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාදීම.
- අදාල වැටලීම් කටයුතු පහසු කරවීම සඳහා එන්ජින් බෝට්ටුවක් ලබාදීම.
- කාර්යාලයට අවශ්‍ය ගෘහභාණ්ඩ ලබාදීම.

වැඩසටහනේ මුල්‍ය අනුග්‍රහය යටතේ සිදුකරවන ලදි.

කලපු අන්තර උදම් කලාපයේ හඳුනාගත් ස්ථාන 03 ක මහ කඩොල් පැළෑටි 6000 ක් රෝපණය කිරීම. ප්‍රදේශයේ කාන්තා කණ්ඩායම් 03 සහභාගී කරගනිමින් සහ සුළු ධීවර සම්මේලනයේ සෘජු සම්බන්ධීකරණ දායකත්වයෙන් සිදු කරන ලදී.

ලෝක සංරක්ෂණ සංගමයේ (IUCN) ජාතික කමිටු සාමාජිකත්වය හා එහි කඩොලානට අනාගතයක් වැඩසටහන Mangrove for the Future (MFF) හා නිසි සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම තුලින් ජාත්‍යන්තරය හා ආයතනික අත්දැකීම් හුවමාරු කරගැනීමට අවස්ථාවක් සලසා ගැනීමට හැකිවිය.



2012 වර්ෂයේ වැඩසටහනේ ප්‍රධාන ඉලක්ක ප්‍රදේශය වූයේ මන්නාරම් ද්‍රෝණිය ආශ්‍රිත සාගර වෙරළාශ්‍රිත පරිසර පද්ධතියයි. වසර 30 ක ජනවාර්ගික ගැටුම් අවධියකට පසුව ප්‍රදේශයේ සිදු කරගෙන යනු ලබන සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් වඩාත් සංවේදී පරිසර පද්ධතීන්ට ඇති සෘජු හා වක්‍ර තර්ජන හා අභියෝග හඳුනාගැනීම සඳහා තත්ව විශ්ලේෂණයක් සිදු කොට වාර්තාවක් සැකසීම සිදුකෙරිණි.

මෙම ව්‍යාපෘතියේ වඩාත් ආකර්ෂණීයම නිමැවුම වූයේ 2010 වර්ෂයේ යුනෙස්කෝව විසින් ප්‍රකාශයට පත් කර ඇති වන්කාලේ ලෝක උරුම රම්සා තෙත් බිම අනාගතය උදෙසා ආරක්ෂා කිරීම සඳහා ප්‍රජා පාදක සංරක්ෂණ මොඩලයක් සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක සංරක්ෂණ සංගමයේ කඩොලානට අනාගතයක් වැඩසටහනේ (MFF) මධ්‍යම මුල්‍යාධාර වැඩසටහනට ව්‍යාපෘති යෝජනාවක් අයැදුම් කිරීමත්, එය ආධාර ලබාදීමට තෝරාගත් ව්‍යාපෘතිය වීමත් ආයතනය ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයකි.

එමෙන්ම ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් අඩුවෙමින් පවතින මුහුදු කූඩැල්ලන්, සංරක්ෂණ ප්‍රයත්නයක් ලෙස කොටු තුල මුහුදු කූඩැල්ලන් වගා කිරීමට ධීවර ප්‍රජාව යොමු කරවීම සඳහා මන්නාරම සවුත්බාර් ධීවර ගම්මානය ඉලක්ක කරගනිමින් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරවීමට ලැබීම ප්‍රදේශයේ ධීවර ප්‍රජාවට ඉහල ආදර්ශයක් ලබාදීමට හැකිවිය.

මන්නාරම් අර්ධද්වීපයට ඇතුලුවන ප්‍රධාන පිවිසුම් මාර්ගයේ දෙපස විනාශ වී ගිය කඩොලාන තීරුව යලි වගාකිරීම සඳහා කඩොලාන පැල 6000 ක් සිටුවීම, ප්‍රදේශයේ ක්‍රියාකාරී සංවිධාන 03 ක් හවුල් කරගනිමින් සිදු කරවන ලදි.

සමස්ථ වැඩසටහනේ ඉලක්ක ප්‍රදේශය තවදුරටත් පුළුල් කරමින් නැගෙනහිර පලාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීයේ ලේකම් කොට්ඨාශයට අයත් පානම ගම්මානයේ ධීවර කාන්තා කණ්ඩායම් 02 ක් ඉලක්ක කරමින් අතිරික්ත ධීවර අස්වැන්න විජලනය කොට කල්තබාගැනීමේ තාක්ෂණය හඳුන්වාදීමත් විජලිත මත්ස්‍ය නිෂ්පාදන කණ්ඩායම් 02 න් ස්ථාපනය කිරීමත්, නියමු ව්‍යාපෘතියක් ලෙස සිදුකරවීමට හැකිවිය.
2012 වර්ෂයේ දැයට සෙවන ජාතික රුක් රෝපන වැඩසටහනට සමගාමීව පානම නාවික හමුදා කඳවුර භූමියේ පිහිටි කලපු ඉවුරු තීරුවේ කඩොලාන පැල 10,000 ක් සිටුවීම නාවික හමුදාව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා එක්ව සිදු කරවන්නට යෙදිනි.

ලෝක සාගර දිනය නිමිත්තෙන් ලෝපුරා සිදු කරන වෙරල තීර පිරිසිදු කිරීමේ වැඩසටහනට දායකත්වය සැපයීමක් ලෙස 2012 සැප්තැම්බර් 15 දින මන්නාරම නගරාසන්නයේ වෙරල තීරයේ කි. මී. 2 ක් හා නිලාවේලි වෙරල තීරයේ කි. මී. 2 ක දුරක් පිරිසිදු කිරීම ප්‍රදේශයේ තරුණ ප්‍රජාව දායක කරගනිමින් සිදුකිරීමට හැකිවිය. මෙම වැඩසටහන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සෘජු සම්බන්ධීකරණයෙන් සිදු කරවන්නට යෙදින.

## 3.7 ලුණුගම්වෙහෙර වම් ඉවුර සංවර්ධන වැඩසටහන

රුහුණු මාගමත්, ඌව වෙල්ලස්සත්, යන අභිමාන ඓතිහාසික පුරවරයන් දෙක තුළ කටෝර ජීවිත ගෙවන මිනිසුන් වෙනුවෙන් ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය වසර ගණනාවක් එම ප්‍රදේශ පිළිබඳව ලද අත්දැකීම් අනුසාරයෙන් ආරම්භ කරන ලද වියළි කලාපීය සංවර්ධන ක්‍රියාවලිය, අරඹා පසු ගිය වසර තුළ එම දුෂ්කරතා ඇති මිනිසුන් වෙනුවෙන් ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය විසින් බොහෝ වැඩ සටහන් රැසක් හා සමාජ මෙහෙවරක් කරමින් ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ යෙදී සිටී.

එපමණක් නොව මොණරාගල දිස්ත්‍රික්කයටත් හම්බන්තොට දිස්ත්‍රික්කයටත් මැදිවනසේ ලුණුගමිවෙහෙර, වම්ඉවුර, සීනුක්කුව ග්‍රාමසේවා වසමේ උප කාර්යාලයක් හා ගොවි ක්ෂේත්‍ර පුහුණු පාසලක් ආරම්භකර ඇත. ඒ තුළින් ප්‍රජා පාදක වැඩ සටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමත් පුහුණු වැඩ සටහන් පැවැත්වීමේ මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරීමටත් මේවන විට කටයුතු කරමින් සිටී. තවද එම ප්‍රදේශ තුළ වියළි කලාපීය සංවර්ධන ගෙවතු වගා වැඩසටහනත්, ප්‍රභාවි හරිත ප්‍රජා මුල සංවිධානය නමින් කාන්තා සංගමයක්ද පිහිටුවා ක්ෂුද්‍ර මුල්‍ය ඉතිරිකිරීම් හා විවිධ වැඩ සටහන් සිදුකරමින් ශක්තිමත් සංවිධාන දිස්ත්‍රික් 02 පුරා ගොඩනංවා ඇත. එමෙන්ම තිරසර පෝෂණ උයන වැඩසටහන වැනි වස විසෙන් තොර ගෙවතු ගොඩනැගීමේ ක්‍රියාවලිය දිස්ත්‍රික් 02 පුරා තෝරාගනු ලැබු ප්‍රාදේශීය බල ප්‍රදේශවල ක්‍රියාවට නැංවේ. සෑම වසරකම පාහේ දිස්ත්‍රීක් 02 තුළ සිදුකරනු ලබන පාසල් පරිසර වැඩ සටහන තෝරාගනු ලබන දුෂ්කරතා ඇති පාසල් දරු දැරියන් හට ළමා පරපුර පරිසරයට ආදරය කළ යුත්තේ කෙසේද? යන්න පාසල් පරිසර වැඩ සටහන් ක්‍රියාවට නැංවු අතර ඉදිරි වසර තුළත් ඒවා ක්‍රියාවට නැංවීමට නියමිතය. එමෙන්ම තෝරාගනු ලබන ප්‍රදේශයන් තුළ දේශගුණික විපර්යාස වලට අනුගතව ගෙවතු වගාව සිදුකිරීම වැනි වැඩසටහන් හා ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව වැඩසටහන් ද ක්‍රියාත්මක වෙමින් තිබේ. එපමණක් නොව ජලය නොමැති කමින් වගා නොකරණ පවුල් 46 ක් ජීවත් වන මොණරාගල දිස්ත්‍රික්කයේ පඩිකැපුහෙල ගම්මානයේ වසර ගණනාවත් අත්හැර දමා තිබූ වැව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ සුළු මූල්‍යාධාර වැඩසටහනේ (UNDP/GEF/SGP) ආධාර යටතේ ප්‍රතසංස්කරණය වෙමින් පවති.





මෙසේ විවිධ වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරණු ලබන ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය ලුණුගම්වෙහෙර ප්‍රජාව සමඟ සිදුකරනු ලැබු වියළි කලාපීය ගෙවතු වගාව අධීක්ෂණය කරමින්, හම්බන්තොට Care ජාත්‍යන්තර ආයතනය 2012 වසර අගභාගයේ එම ආයතනයේ Leed ව්‍යාපෘතිය යටතේ තිරසර ගෘහ ආර්ථිකයක් ගොඩනැගීමේ ගෙවතු වගා ව්‍යාපෘතියක් ද ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය සමඟ එක්ව සිදුකරමින් පවතී. එපමණක් නොව දිස්ත්‍රික් 2 තුළ රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සමග සුහදව හා සහයෝගයෙන් කටයුතු කරනු ලබයි.

එසේ විවිධ ව්‍යාපෘති හා වැඩ සටහන් රැසක් සිදුකරමින් දුෂ්කරතා ඇති අඩු ආදායම් ලාභී පවුල් සඳහා සිදුකරනු ලබන වැඩසටහන් පිළිබඳ 2011-2012 වසර තුළ ක්‍රියාකාරකම් පහත ප්‍රදේශයන් වල දියත් කරන ලදී.

| කණ්ඩායම පිහිටි ප්‍රදේශය | සාමාජික සංඛ්‍යාව | ආරම්භ කිරීමට අපේක්ෂිත නව කණ්ඩායම් |
|---|---|---|
| අම්බලන්තොට- රොටවල | 30 | මාමඩල |
| හඳුන්කටුව | 19 | හුංගම |
| වැටිය | 20 | ඇල්ලගල වම් ඉවුර |
| | | හඳගිරිය |
| | | වැලිවැව |

## 3.8 ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, අර්ධ නාගරික සහ නාගරික ජන සමාජයේ පවතින දිළිඳු බව අවම කරමින්, යහපත් හෙට දිනක් ලඟාකර ගැනීම සඳහා මුදල් පමණක් නොව තම කාලය, ශ්‍රමය, සංස්කෘතිය, දේශීයත්වය, උරුමයන් ඉතිරිකරමින්, ඉතුරුම් ජීවන රටාවකට හුරු කරවීම සහ තම ජීවිතය උසස් කර ගැනීමට වෙර දරණ කාන්තා පරපුර සඳහා අත්වැල් සපයමින් කාන්තා සවිබල ගැන්වීමක් මෙම වැඩසටහන හරහා ක්‍රියාත්මක විය.



ස්වයංපෝෂිත ජීවන රටාවකට උරුමකම් කියූ ග්‍රාමීය කාන්තාව පවතින ආර්ථික රටාවන් හමුවේ ගොදුරක් බවට පත්වීම හේතුවෙන් තම පවුලේ ආදායම ගැන වෙහෙසෙන  තත්ත්වයකට පත්ව ඇත. එසේම වර්තමානය වන විට විවිධ ගෘහ උපකරණ සමාජයට හඳුන්වාදීමත් සමඟ එම උපකරණ ගැනීමේ උවමනාව කාන්තාවන්ගේ තරඟකාරී ආශාවක් බවට පත්වී තිබේ. මෙවැනි තරඟකාරී ජීවන රටාවන් ගමතුළට ගලා ඒමත් සමඟම එයට විකල්ප ලෙස විවිධ සංවිධාන විසින් විවිධ කාරනා යටතේ සංවිධාන ව්‍යුහයක් ඇති කරමින් ඉතුරුම් හා ණය ක්‍රමවේදයන් හඳුන්වා දෙන ලදී. එම ක්‍රම වේදයන් වර්තමානය වන විට දියුණු වීමත් සමඟ ග්‍රාමීය ප්‍රජාවගේ දියුණුව වෙනුවෙන් කටයුතු කරන සංවිධාන ජාලයන් මේ වන විට ගම්මාන තුළ ව්‍යාප්ත වෙමින් පවතී.

නමුත් එසේ සංවිධාන බොහොමයක් ගමතුල පිහිටා තිබුනද කාන්තා ව විවිධ හේතුන් යටතේ පිඩාවට පත්වන බව අප දැක ඇත. එම නිසා නව ක්‍රම වේදයන් යටතේ ප්‍රජා සංවිධානයන් බිහිකරමින් සාධාරණ සුරැකුම් ක්‍රමවේදයන් හා කාන්තාව තුළ සංවිධාන ගොඩනගා එම සංවිධානයට බලය පවරමින් යන කණ්ඩායම් ක්‍රමවේදයන් හදුන්වාදි, තම ඉතිරි කිරීම් තමාගේ අභිවෘධිය හා පවුලේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීමටත් ගම තුළ සාමුහිකත්වය පදනම් කරගත් ක්ෂුද්‍ර මුල්‍ය ඉතුරුම් වැඩ සටහනක් ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය විසින් 2011 මැද භාග යේ සිට ක්‍රියාත්මක විය. පහත සඳහන් ගම්මානවල ඉතුරුම් වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී.

**මොණරාගල දිස්ත්‍රික්කය**

| | | |
|---|---|---|
| තණමල්විල | - | පඩිකැපුහෙල, පිළිමහෙල, තම්මැන්නාව, කුඩාගම්මාන 1-2, ඇල්ලගල වම් ඉවුර, සඳගල1 - 2 |
| සීනුක්කුව | - | ලුණුගම්වෙහෙර |
| වැල්ලවාය | - | කුරුගම වසම, වෙහෙරයාය, රන්දෙනිගොඩයාය, මඩුල්ල, තණමල්විල |

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

අම්බලන්තොට, රොටවල, හඳුන්කටුව, වැටිය, මාමඩල, හුංගම, උද්දගන්දර, සිරියාගම,

**මාතර දිස්ත්‍රික්කය**

| | | |
|---|---|---|
| වැලිගම | - | හේන්වල, කොටවිල, මඩිහ, දික්වැල්ල-කෙමගොඩ, |
| දෙවිනුවර | - | තලල්ල, වැලිපිටිය-බැද්දකොනවිලවත්ත |

| | | |
|---|---|---|
| **ගාල්ල දිස්ත්‍රික්කය** | - | පනුගල්ගොඩ, විසල් උයන |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | - | තන්තිරිමලය, එප්පාවල |
| **පුත්තලම දිස්ත්‍රික්කය** | - | ඇතුන්ගොඩ, කොට්ටුකච්චිය |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය** | - | කොත්මලේ |
| **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය** | - | කන්තලේ |

### 3.9 තුරුණු මිහිසරණිය හරිත සේනාංකය

2011 වර්ෂය තුළ තුරුණු මිහිසරණිය හරිත සේනාංකයේ නව කණ්ඩායම් ඇති කිරීමේදී ප්‍රමුඛත්වය දෙනු ලැබුවේ යුද්ධයෙන් විනාශවී ගිය උතුරේ දිස්ත්‍රික්ක සඳහායි. විශේෂයෙන්ම පරිසර සංරක්ෂණය, දේශගුණය වෙනස් වීම, කෘෂිකර්මය, තිරසර සංවර්ධනය යන තේමාවන්ට අදාළව සැකසුණු විෂය මාලාවක් යටතේ නව කණ්ඩායම් පුහුණු කරන ලදී.

ඒ අතර ගැටුම් නිරාකරණය හා සාමය ගොඩ නැගීම සම්බන්ධවද උතුරු ප්‍රදේශය මුල් කර ගනිමින් පුහුණු වැඩසටහන් දියත් කරන ලදී.මේ සඳහා උතුරේ තොරාගත් දිස්ත්‍රික්කයන් වන කිලිනොච්චිය, යාපනය, මන්නාරම හා වව්නියාව යන දිස්ත්‍රික්කවල තෝරාගත් සාමාජිකයින් සම්බන්ධ කරගනු ලැබීය. එසේම බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, හම්බන්තොට, මොනරාගල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය,යාපනය, වව්නියාව, කිලිනොච්චිය, මන්නාරම, යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් රැස්වීම් පවත්වමින් විශේෂයෙන්ම පරිසර සංරක්ෂණය, ආපදා කළමනාකරණය, දේශගුණික විපර්යාසය හමුවේ මුහුණ දෙන ආකාරය පිළිබඳව ද දැනුවත් කරන ලදී.

නුවරඑළිය, බදුල්ල, හම්බන්තොට, මොනරාගල, අම්පාර, මඩකලපුව,මහනුවර, මාතලේ යන දිස්ත්‍රික් අතර අත්දැකීම් හුවමාරු වැඩසටහන් හා වාර්තා වැඩසටහන් සංවිධානය කරනු ලැබූ අතර අදාල දිස්ත්‍රික් තුළ අපද්‍රව්‍ය කළමනාකරණය, පරිසර ගවේශණය, රුක්රෝපණය, ඩෙංගු මර්ධන වැඩසටහන් හා පොදු ස්ථාන පිරිසිදු කිරීම වැනි ක්‍රියාකාරකම් සිදු කෙරිණි.

## 4. වෙනත් ක්‍රියාකාරකම්

## තිරසර සංවර්ධනය පිළිබඳ (RIO+20) සමුළුව හා ජෛව විවිධත්ව සමුළුව (COP-11) වෙනුවෙන් ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ දායකත්වය


### 04.01 තිරසර සංවර්ධනය පිළිබඳ (RIO+20) සමුළුව


බ්‍රසීලයේ රියෝ ද ජැනෙයිරෝ නගරයේ දී 2012 ජුනි මාසයේදී පැවැති තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව හෙවත් රියෝ+20 සමුළුව පසුගිය දශකයක පමණ කාලයේදී පවත්වන ලද ප්‍රධානතම ජාත්‍යන්තර පරිසර සමුළුව වේ. මෙහිදී තිරසර සංවර්ධනය සඳහා හරිත ආර්ථිකය පිළිබඳ සාකච්ඡාව වැදගත් මාතෘකාවක් වූ අතර අනාගත ලෝකයේ සංවර්ධන ගමන් මග කෙබඳු විය යුතුද? යන්න තීරණය වන සමුළුවක් ලෙස මෙය සැලකිය යුතු තරම් අවධානයකට ලක් විය.

රියෝ+20 සමුළුව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද පොදු වැඩසටහන සඳහා ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය විශාල දායකත්වයක් දැරීය. මේ කාර්යය සඳහා පිහිටුවා ගන්නා ලද 'ශ්‍රී ලංකා රියෝ එකමුතුවේ' ප්‍රධාන පාර්ශ්වකරුවා ලෙස ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය ක්‍රියා කළේය. නෝර්වේජියානු සංවර්ධන අරමුදල හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට අනුබද්ධ ජගත් පරිසර පහසුකම යටතේ සුළු මූල්‍යාධාර වැඩසටහන (UNDP/ GEF/ SGP) විසින් මේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අනුග්‍රහය දක්වන ලදී.

ශ්‍රී ලංකා රියෝ එකමුතුව ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් දියත් කරන ලදි. ඒවා මෙසේය.

- තිරසර සංවර්ධනය පිළිබඳ පුරවැසි වාර්තාව 2012 - මෙය ගතවූ 2002-2012 දශකය ඇතුළත ශ්‍රී ලංකාවේ සිදුවූ සංවර්ධනය පිළිබඳව විවිධ අංශ ඔස්සේ සිදුකරන ලද විවරණයකි. එය සකස් කිරීමේදී ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ සාමාජික සංවිධාන සියල්ල වෙතින්ද අදහස් විමසන ලද අතර සංවිධාන 20 ක් පමණ ඊට ප්‍රතිචාර දක්වා තිබිණි. එසේම විවිධ සංවිධාන හා පුද්ගලයින් සමඟ පවත්වන ලද සාකච්ඡා මාලාවකින් පසුව සංස්කරණය කරන ලද ඉංග්‍රීසි බසින්වූ වාර්තාව 2012 ජුනි මස පැවැති උත්සවයකදී එළිදක්වන ලදි. සුරන්ජන් කොඩිතුවක්කු මහතා විසින් එය බ්‍රසීලයේ රියෝද ජැනේරෝ නගරයේදී නිල වශයෙන් එළිදක්වන ලදී. ඉංග්‍රීසි වාර්තාවේ සිංහල පරිවර්තනය (සංශෝධන සහිත) හා දෙමළ පරිවර්තනය ඉන් පසුව එළිදැක්වීමට කටයුතු සූදානම් කර තිබේ.



- පරිසර අමාත්‍යංශය, ජාතික තරුණ සේවා සභාව, විදුසර විද්‍යා සඟරාව, ශ්‍රී ලංකා තරුණ ජීවවේදීන්ගේ සංගමය හා තවත් ආයතන රැසක දායකත්වයෙන් 'තුරුණු සොබාසර' නමින් තරුණ/ ශිෂ්‍ය සංකල්ප රචනා නිර්මාණ තරඟාවලියක් සංවිධානය කරන ලදි. එහි අරමුණ වූයේ වර්තමාන පරිසර සංරක්ෂණය හා සම්බන්ධ කටයුතු පිළිබඳව තරුණ පරපුර අතර උනන්දුවක් ඇති කිරීමයි. සාර්ථකව ක්‍රියාත්මක වූ මෙහි ත්‍යාග ප්‍රදානෝත්සවය 2012 ජුනි මස 12 වන දින පරිසර අමාත්‍යතුමා හා වෙනත් අමුත්තන් රැසකගේ ප්‍රධානත්වයෙන් යුතුව බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයීය ශ්‍රවණාග ාරයේ දී පවත්වන ලදි. මෙහිදී සමස්ත ලංකා හා පළාත් මට්ටමේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග ලබා දෙන ලදී.




- පරිසර අමාත්‍යංශය විසින් සකස් කරන ලද රාජ්‍ය මට්ටමේ වාර්තාව හා සම්බන්ධ සාකච්ඡා සඳහා සුරන්ජන් කොඩිතුවක්කු මහතා ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය වෙනුවෙන් සම්බන්ධ විය.

- තිරසර සංවර්ධනය හා සම්බන්ධ මාතෘකා පිළිබඳව අවධානය යොමු කළ පාපැදි සවාරියක්වූ පරිසර හිතකාමී ස්වේච්ඡා සංවිධානය (ECO-V) මගින් සිදුකරන ලද පාපැදි 2013 පාපැදි සවාරියට හරිත ව්‍යාපාරයද දායක විය.

රියෝ+20 සමුළුවේදී ඇතිකරගත් එකඟතාව වන 'හෙට දවසේ අපේ අපේක්ෂාව' නම් ලියැවිල්ලේ ඇති වඩාත් වැදගත් ප්‍රතිදානය වන්නේ 2015 වර්ෂයේදී එකඟ වීමට නියමිතව ඇති තිරසර සංවර්ධන ඉලක්ක සකස් කිරීමයි. රාජ්‍ය මට්ටමින් මේ සඳහා අදාළ වගකිවයුත්තන් මැදිහත්විය යුතු අතර ඒ කාර්යයයේදී ලෝකය පුරා ක්‍රියාත්මක සිවිල් සංවිධානවල යම් වගකීමක් ඇති බව පැහැදිලි කරුණකි. මේ පිළිබඳ පුළුල් මට්ටමේ සාකච්ඡාවක් ඇතිවිය යුතුව තිබේ.

## 04.02 ජෛව විවිධත්ව සමුළුව (COP 11)



වසර දෙකකට වරක් පැවැත්වෙන ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියේ පාර්ශ්වකරුවන්ගේ

11 වන සමුළුව හෙවත් COP 11 සමුළුව ඉන්දියාවේ හයිද්‍රාබාද් නගරයේදී 2012 ඔක්තෝබර් මස 8 දින සිට 19 දා දක්වා පවත්වන ලදි. මේ සමුළුව ලෝකයේ ජෛව විවිධත්වය පිළිබඳව පැවැත්වෙන විශාලතම සමුළුව වේ. ලෝකය පුරා රටවලින් රාජ්‍ය, රාජ්‍ය නොවන හා වෙනත් අංශවල නියෝජිතයන් හා නිරීක්ෂකයන් දසදහසකට

ආසන්න පිරිසක් මීට සහභාගි වූහ.මේ ජෛව විවිධත්ව සමුළුව සඳහා සම්බන්ධවීමට ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය වැඩසටහනක් සකස් කළ අතර, ඒ සඳහා හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට අනුබද්ධ ජගත් පරිසර පහසුකම් සුළු මූල්‍යාධාර වැඩසටහන යටතේ (UNDP/ GEF/ SGP) මූල්‍යමය සහයෝගය ලැබිණි.

මේ සමුළුව සඳහා සූදානම් වීම වෙනුවෙන් වැඩමුළුවක් 2012 වර්ෂයේ සැප්තැම්බර් මස විජේරාම හෙල්ප් - ඒජ් ආයතනයේදී පවත්වන ලදී. අයිචි ජෛව විවිධත්ව ඉලක්ක, නගෝයා සන්ධානය, යන මාතෘකා යටතේ සම්පත් දායකයින් කිහිපදෙනෙක් මෙහිදී දේශන පැවැත්වූ අතර ජෛව විවිධත්වය සම්බන්ධයෙන් මේ වන විට ඇති අර්බුදය කවරේද? යන්න පිළිබඳව වැඩමුළුවක් ද පවත්වන ලදි. එසේම මෙරට ජෛව විවිධත්වය හා සම්බන්ධ කරුණු ඇසුරින් ජෛව විවිධත්වය ආශ්‍රිත කරුණු ඇතුළත් ප්‍රතිපත්තිමය ලියැවිල්ලක් සකස් කරන ලද අතර එහි කෙටුම්පත හයිද්‍රාබාද් සමුළුව සඳහා පිළියෙල කරන ලද්දකි. මේ වැඩමුළුව සඳහා ජෛව විවිධත්වය ආශ්‍රිතව කටයුතු කරන සාමාජික සංවිධාන රැසක නියෝජිතයෝ සහභාගි වූහ.

හයිද්‍රාබාද් සමුළුව වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නිරීක්ෂකයන් ලෙස ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය නියෝජනය කරමින් නියෝජිත පිරිසක් සහභාගි විය. ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ ස්වාභාවික සම්පත් සංරක්ෂණ හා කළමනාකරණ වැඩසටහන, ආහාර ස්වෛරීභාවය හා තිරසර ගොවි කටයුතු පිළිබඳ වැඩසටහන හා ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව කළමනාකරණ ව්‍යාපෘතිය නියෝජනය කරමින් ගයාන් ප්‍රදීප් විජේතුංග, නිමල් කුමාරතුංග හා චමින්ද ලාල් කුමාර යන ක්‍රියාකාරීන් තිදෙනාද, පරිසරවේදියකු වන රවීන්ද්‍ර කාරියවසම්ද, මාධ්‍යවේදීන් දෙදෙනකු වන අමල් උඩවත්ත හා ධනේෂ් විසුම්පෙරුමද ඇතුළත් වූහ. එසේම පොදුජන හිමිකම් කමිටුව, ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය අරණායක හා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමය යන සංවිධාන නියෝජනය කරන තවත් ක්‍රියාකාරීන් තිදෙනකු සඳහා ආංශික අනුග්‍රහයක්ද දක්වන ලදි.

මෙහිදී ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය නියෝජනය කළ නියෝජිත පිරිස් හයිද්‍රාබාද් සමුළුවේ ප්‍රධාන සැසිවාරවලට මෙන්ම ආංශික වැඩසටහන් රැසකටද සම්බන්ධ වූහ. ඔවුන් වැඩි උනන්දුවක් දැක්වූ ක්ෂේත්‍ර අතර ජෛව විවිධත්ව සංරක්ෂණය, කෘෂිකර්මය හා කෘෂි ජෛව විවිධත්වය, භූමි භාවිතය, සාගර ජෛව විවිධත්වය වැනි අංශ මූලික විය. ජෛව විවිධත්වය පිළිබඳ ගිවිසුම හා එය යටතේ පිහිටුවා ගෙන ඇති කාටජෙනා සන්ධානය පිළිබඳ සාකච්ඡාවලට සම්බන්ධ වීම සඳහා නියෝජිතයන්ට අවස්ථාව ලැබිණි. එසේම ඉන්දියාවේ හා වෙනත් දියුණු රටවල ජෛව විවිධත්වය පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහාද අවස්ථාවක් මෙහිදී උදා විය.

මෙහිදී ඇතිකරගන්නා ලද සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය නියෝජනය කළ ක්‍රියාකාරීන් කටයුතු කරයි. එසේම ඊට සම්බන්ධ වූ මාධ්‍යවේදීන් විසින් අදාළ සමුළුව හා ඒ හා අදාළ කරුණු පිළිබඳව පුවත්පත්වලට ලිපි සපයා තිබේ. මේ පිළිබඳව සෙසු ක්‍රියාකාරීන් දැනුවත් කිරීම සඳහාද ක්‍රියාකර තිබේ.

# 5. ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ වැඩසටහන් කළමනාකරුවන්

- **යහ පාලනය හා ඒකාබද්ධ වැඩසටහ**
  - සුරන්ජන් කොඩිතුවක්කු
- **ස්වභාවික සම්පත් කළමනාකරණ හා සංරක්ෂණ වැඩසටහන**
  - බන්දුරංග කාරියවසම්
  - ගයාන් ප්‍රදීප් විජේතුංග
- **ආහාර ස්වෛරීභාවය හා තිරසර ගොවිතැන පිළිබඳ වැඩසටහන**
  - නිමල් කුමාරතුංග
- **ජාල සම්බන්ධීකරණ අංශය**
  - රන්ජන් කරුණානායක
- **ආධාර අධීක්ෂණ වැඩසටහන**
  - ජනක විතානගේ
- **දේශගුණික විපර්යාස පිළිබඳ පොදුජන ලේකම් කාර්යාලය**
  - රොෂාන් සාලින්ද
- **ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව කළමනාකරණ ව්‍යාපෘතිය**
  - චමින්ද ලාල් කුමාර
- **සාගර හා වෙරළ ආශ්‍රිත සම්පත් සංරක්ෂණය හා කළමනාකරණ වැඩසටහන**
  - උපුල් ජයතිලක
- **ලුණුගම්වෙහෙර වම් ඉවුර සංවර්ධන වැඩසටහන**
  - ජනක විතානගේ
- **තුරුණු මිහිසරණිය හරිත සේනාංකය**
  - ජනක විතානගේ
- **ප්‍රධාන ගණකාධිකාරී**
  - කසුන් චන්ද්‍රසේකර
- **ප්‍රධාන පරිපාලන නිළධාරිනී**
  - රසිකා පෙරේරා

## 6. විධායක කමිටු සාමාජිකයින්

- **සුරන්ජන් කොඩිතුවක්කු** - සභාපති
- **ගාමිණී රුබේරු** - උප සභාපති
- **දමිතා සමන්මලී පීරිස්** - සම ලේකම්
- **චන්ද්‍රහේවා ගාල්ලගේ** - සම ලේකම්
- **ලයනල් තිලකරත්න** - භාණ්ඩාගාරික
- **ජනක ඉඳුරුවගේ** - විධායක කමිටු සාමාජික
- **ටී. ජී. ජී. එල්. ඉන්දික** - විධායක කමිටු සාමාජික
- **අබ්දුල් සමීල්** - විධායක කමිටු සාමාජික
- **රැෆඩ් මොසාෆ්** - විධායක කමිටු සාමාජික
- **වයි. තයානි** - විධායක කමිටු සාමාජිකා

# 7. 2011/2012 වර්ෂයේ සාමාජික සංවිධාන ලේඛනය

**කොළඹ දිස්ත්‍රික්කය**

01. සෙනෙහස පරිසර සංවිධානය
02. පරිසරය සුරැකීමේ හවුල්කරුවෝ (PEP)
03. සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය (කාන්තා බැංකුව)
04. ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ සංසදය
05. ජීවිත හා පරිසරය සුරැකීමේ සංවිධානය
06. ඒකාබද්ධ දිරිය කාන්තා සමිතිය
07. රෙජිඩේල්වත්ත කෘෂිකර්ම, කර්මාන්ත හා පරිසර සංවර්ධන සමිතිය
08. ඒකාබද්ධ සමගි කාන්තා සමිතිය
09. පාරිසරිකයෝ
10. විකල්පනී ජාතික කාන්තා සන්ධානය

**ගම්පහ දිස්ත්‍රික්කය**

11. අරුණෝදය පාරිසරිකයෝ
12. පාරිසරික හා පාරිභෝගික ගැටළු පිළිබඳ කමිටුව
13. රද්දොළුගම සුමිතුරෝ
14. ගෝකුල පරිසර අසපුව

**කළුතර දිස්ත්‍රික්කය**

15. පොදුජන හිමිකම් කමිටුව
16. සොබා ශ්‍රී පාරිසරික සංසදය
17. ප්‍රජා හා පාරිසරික සංවර්ධන පදනම
18. හරිත මිතුරෝ
19. සියපත පරිසර සංගමය
20. අරුණළු ඒකාබද්ධ අරමුදල
21. මිහිතල මිතුරෝ පරිසර සංවර්ධන පදනම
22. ප්‍රජා කේන්ද්‍රීය සම්පත් හුවමාරුව (CORE)
23. ඒකාබද්ධ සමාජ සංවර්ධන පදනම
24. කුකුළේගඟ ජනමාධ්‍යවේදී කේන්ද්‍රය

**ගාල්ල දිස්ත්‍රික්කය**

25. මානව සම්පත් පාරිසරික සංවර්ධන ආයතනය
26. සත්විජය පදනම
27. හික්කඩුව සහභාගීත්ව සංවර්ධන පදනම
28. දකුණේ ධීවර සංවිධානය
29. ප්‍රජා ශක්ති සංවර්ධන පදනම

30. එප්පල එක්සත් සුභසාධක සමිතිය
31. ප්‍රජා සංවර්ධන සංවිධාන කේන්ද්‍රය
32. ස්වශක්ති දිරිය පදනම
33. මිහිකත සහජීවන සංවර්ධන පදනම

**මාතර දිස්ත්‍රික්කය**

34. තිස්ස ජය ළමා සුභසාධක පදනම
35. සුභදවන්තයින්ගේ සමාජය
36. සොබා ශක්ති පරිසර පදනම
37. තරුණ පාරිසරික සංසදය
38. ජනාශ්‍ර පදනම
39. කිරිනැලිය - පිටදෙනිය ග්‍රාම සංවර්ධන කාන්තා සමිතිය
40. සී/ර කනංකේ සණස සමිතිය
41. විල්පිට 'සමඟි' කුඩා තේවතු සංවර්ධන සමිතිය
42. සුමිතුරු යෞවන සමාජය හා දිගුවැල ප්‍රජා මූල සංසදය
43. සුරස සංවර්ධන පදනම
44. පහතරට ප්‍රජා සංවිධාන සංසදය
45. දිමුතු කාන්තා කාර්ය සංවිධානය
46. අඑත්ගොඩ එක්සත් සුභ සාධක සමිතිය
47. ගැමි කිරුළ ප්‍රජා සංවර්ධන හා පාරිසරික පදනම
48. සදහම් මිතුරෝ සමිති සම්මේලනය

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

49. අරුණලු ප්‍රජා සංවර්ධන පදනම
50. දක්ෂිණ මිත්‍රත්ව ප්‍රජා සංවර්ධන පදනම
51. රුහුණු හරිතවේදීන්ගේ සංගමය
52. මාගම ගැමුණු නිෂ්පාදන ගොවි සමිතිය
53. හම්බන්තොට දිස්ත්‍රික් කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය
54. ශක්ති ගොවි සංවිධානය
55. ජෛව විවිධත්ව පාරිසරික සංවිධානය
56. ජාතික සේවා පදනම
57. රතු අඩසඳ මිතුරු සමාජය
58. කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන සේවා මධ්‍යස්ථානය
59. රොටවල ඒකාබද්ධ සංවිධානය
60. මාගම-කිරින්ද වැලිවැටිය සුරැකීමේ සංවිධානය

**මොණරාගල දිස්ත්‍රික්කය**

61. ඩී.සී. 4-5 ඉසුර ගොවි සංවිධානය
62. පහළ ඌව මානව සම්පත් සුරැකීමේ සංවිධානය
63. වෙල්ලස්ස සංවර්ධන පදනම
64. කවුඩාව නවෝදා ඉසුරු සමාජය
65. ප්‍රතිභා කාන්තා සංවිධානය

66. මානව සංවර්ධන සංසදය
67. සරස්වතී කාන්තා සංවිධානය
68. සමගි සංවර්ධන කාන්තා සංවිධානය
69. ඌව වෙල්ලස්ස ගොවි කාන්තා සංවිධානය

**බදුල්ල දිස්ත්‍රික්කය**

70. කීනිගම එළවලු හා පළතුරු නිෂ්පාදනය හා අලෙවිකරන්නන්ගේ සංගමය
71. ජෛව විවිධත්ව පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (BRIT)
72. හපුතලේ සමාජ සංවර්ධන මධ්‍යස්ථානය
73. කඳුරට සංවර්ධන පදනම
74. ආදිවාසීන්ගේ තරුණ සංවිධානය

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

75. වලපනේ ග්‍රාමීය සහයෝගීතා සංවිධානය
76. ඉසුරු ජීවිතෝදය පදනම
77. අවදි ලංකා
78. Sri Lanka Center of Sustainable Alternative Solution
79. සියටැල් ව්‍යාපාරය
80. ලක්ෂපාන වන දිය දහර පරිසර සංවිධානය
81. පරිසර ගවේශණ හා සංරක්ෂණ සංගමය

**මහනුවර දිස්ත්‍රික්කය**

82. නිර්මාණ ශ්‍රී ලංකා
83. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ මධ්‍යස්ථානය
84. ග්‍රීන් ලර්න් ශ්‍රී ලංකා
85. රත්නාලෝක කණ්ඩායම
86. පරිසර පියස සංවිධානය
87. කඳුරට ප්‍රජා සංවර්ධන සංසදය
88. පරිසර සුරැකුම් හා විද්‍යා ගවේශණ සංවිධානය
89. කුණ්ඩසාලේ ප්‍රජා සංවර්ධන පදනම
90. වැවිලිකරයේ කාන්තා සංවර්ධන සංවිධානය
91. පාරිසරික හා ගොවි කටයුතු සංවර්ධන මධ්‍යස්ථානය
92. සී/ස මැදදුම්බර කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය,

**මාතලේ දිස්ත්‍රික්කය**

93. පරිසරය හා ස්වභාව සංවර්ධන කේන්ද්‍රය
94. නා උල ග්‍රාමීය සංවර්ධන මහා සංගමය
95. කඳුරට සොබාදම් ආරක්ෂණ සමාජ ආර්ථික පදනම

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

96. පඩුවස්නුවර ග්‍රාමීය සංවර්ධන හා සුභ සාධක සංවිධානය (පණ්ඩුක සංවිධානය)
97. සංවර්ධනය සඳහා වන ග්‍රාමීය මධ්‍යස්ථානය (සංග්‍රාම)
98. දිරියලිය කණ්ඩායම
99. තිස්ස එකමුතු කණ්ඩායම

**පුත්තලම දිස්ත්‍රික්කය.**

100. සාමකාමී පරිසර සුරක්ෂිත අයිතිවාසිකම් සඳහා දීර්ඝකාලීන විසඳුම් (පර්ල්ස්)
101. නවෝදා ගොවි සංවිධානය
102. ලියගොමු කාන්තා එකමුතුව
103. මිහිසර පරිසර සංවිධානය
104. මිහිකත පරිසර සුරැකීමේ සංවිධානය

**රත්නපුර දිස්ත්‍රික්කය**

105. පරිසරය හා ළමා අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානය (OECRP)
106. ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන කාන්තා මහා සංගමය
107. ඒකාබද්ධ කාන්තා මහා සංගමයේ මුත්තෙට්ටුපොල කළාප කාර්යාලය
108. ස්වශක්ති මහා සංගමය
109. සිංහරාජ සුමිතුරෝ - අඹගහකන්ද
110. කෝන්ගස්තැන්න ජල පාරිභෝගික සමිතිය

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

111. දිරිය වන ජීවී ප්‍රජා මූල සංවිධානය

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

112. වන්නි ප්‍රජා සංවර්ධන පදනම
113. ස්වභාවික සම්පත් ආරක්ෂා කරන්නන්ගේ සංගමය,
114. වකුගඩු රෝග නිවාරණ තරුණ පදනම
115. හරිත පියස කණ්ඩායම
116. වැව්සිරි කණ්ඩායම

**කෑගල්ල**

117. ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය
118. ශ්‍රී ලංකා පරිසර ගවේශන සංගමය
119. වරකාපොළ සාමුහික සංවර්ධන සංවිධානය
120. සහභාගීත්ව සංවර්ධන මධ්‍යස්ථානය
121. නිර්මාණී සංවර්ධන පදනම

## වව්නියාව දිස්ත්‍රික්කය

124. Rural Women Forum (RWF)

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

125. Rural Economic & Community Development Organization (RECDO)
126. National Collaboration Development Foundation (NCDF)
127. Sim Sri Lanka

## මඩකළපුව දිස්ත්‍රික්කය

128. NETHRA
129. District Economic Social Welfare Organization (DESMIO)
130. Working Women's Development Foundation (WWDF)
131. Beacon of the East – Social Service Organization (Besso )
132. Community Resources Development Centre (CRDO)
133. SCAF Welfare Organization.
134. Heards – O –Sri Lanka
135. Greenco Oganization

## අම්පාර දිස්ත්‍රික්කය

136. පානම්පත්තුව පරිසර ගවේශණ සංගමය
137. Natural Environmental Social Development Organization(NESDO)
138. NESSO
139. MADIUGAM

## යාපනය දිස්ත්‍රික්කය

140. Center for Child Development (CFCD)

# 8. 2011/2012 වර්ෂයේ ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ ජාතික හා අන්තර්ජාතික නියෝජනයන්

**ජාතික මට්ටමේ නියෝජනයන්**

- පරිසර අමාත්‍යංශයේ ජෛව විවිධත්ව ඒකකයේ ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටුව - සාමාජික
- ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ ජාතික ධීවර ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටුව - සාමාජික
- ආපදා කළමනාකරණ කවුන්සිලය - කමිටු සාමාජික
- දිගුකල් පවත්නා ඓන්ද්‍රීය දූෂකාරක සඳහා වූ කමිටුව - සාමාජික
- ලෝක සංරක්ෂණ සංගමය - ජාතික මෙහෙයුම් කමිටු සාමාජික
- ආක්‍රමණික ශාඛ විශේෂ සඳහා ජාතික මෙහෙයුම් කමිටුව - සාමාජික
- සාම්ප්‍රදායික දැනුම සඳහා ප්‍රතිපත්ති සම නීති සම්පාදනය කිරීමේ කමිටුව - සාමාජික
- අනාගතය සඳහා කඩොලාන- ජාතික මෙහෙයුම් කමිටු සාමාජික
- දෙවන ජාතික සන්නිවේදන ව්‍යාපෘති සැකසීම් කමිටුව - සාමාජික
- දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය - සාමාජික
- දේශගුණික විපර්යාස සහා අනුගතවීමේ ජාතික සැලසුම් සකස් කිරීමේ කමිටුව- සාමාජික

**2011/2012 වර්ෂයේ හවුල්කාරීත්ව ආයතන**

- නෝර්වේජියානු සංවර්ධන අරමුදල (Development Fund (DF) Norway)
- ඔක්ස්ෆෑම් ඔස්ට්‍රේලියා (Oxfam Australia)
- ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව ජාලය (Local Initiative for Biodiversity, Research and Development (LI-BIRD)
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ගෝලීය පරිසර පහසුකම් සුළු මූල්‍යාධාර වැඩසටහන (United Nations Development Program) (UNDP/GEF/SGP)
- ලෝක සංරක්ෂණ සංගමය - (International Union for Conservation of Nature) (IUCN)
- Future Auto Mobile
- Care Intarnational
- වඩාත් යහපත් ලෝකයක් උදෙසා ජාත්‍යන්තර වැඩසටහන (More and Better International Program)

# 9. ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ කාර්ය මණ්ඩලය -2011/2012

| සභාපති/ප්‍රධාන විධායක | ජාල සම්බන්ධීකරණ අංශය |
|---|---|
| සුරන්ජන් කොඩිතුවක්කු | රන්ජන් කරුණානායක |
| **උපදේශක** | **ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන** |
| අර්ජුන සෙනෙවිරත්න | ගාමිණී රුබේරු |
| **පරිපාලන අංශය** | **ගිණුම් අංශය** |
| රසිකා පෙරේරා<br>නර්මදා කුමාරි<br>ඉසුරු උමංගා<br>අයරින් චන්ද්‍රා<br>කසුන් මධුරංග<br>එන්.ජී. යසරත්න<br>එච්.පී.ඩී. පියරත්න<br>නිශාන්ත හිරිපිටිය | කසුන් චන්ද්‍රසේකර<br>යෝගා කල්පගේ<br>තනුජා දිල්රුක්ෂි |
| **ස්වාභාවික සම්පත් සංරක්ෂණ හා කළමනාකරණ වැඩසටහන** | **දේශගුණික විපර්යාස පිළිබඳ පොදුජන ලේකම් කාර්යාලය - "සිහිල් දියත"** |
| බන්දු රංග කාරියවසම්<br>ගයාන් ප්‍රදීප් විජේතුංග | රොෂාන් සාලින්ද<br>ඈපා උපසේන<br>චමෝදි අයේෂා |
| **ආහාර සුරක්ෂිතතාවය හා තිරසර ගොවිකම් වැඩසටහන** | **ප්‍රජා පාදක කෘෂි ජෛව විවිධත්ව ව්‍යාපෘතිය සහ ප්‍රජා සහභාගීත්ව ශාක හා සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය** |
| නිමල් කුමාරතුංග<br>කේ. එච්. සන්දික<br>අමල් සංජීව<br>දිනුෂිකා ජයසිංහ<br>ඒ. ජී. චන්ද්‍රිකා<br>එච්.එම්. සෝමපාල<br>ඒ. වී. රෙජිත්<br>කුමුදුනී දිල්රුක්ෂි | එච්. එල්. ඩී. ලක්මිණී<br>චමින්ද ලාල් කුමාර<br>දයානි විනීතා<br>රේණුකා මානෙල්<br>ජී.ජී. ප්‍රේමවතී<br>ධම්මිකා ප්‍රියදර්ශනී<br>ගයාන් ප්‍රදීප් |

| ලුණුගම්වෙහෙර වම් ඉවුර සංවර්ධන වැඩසටහන | මාධ්‍ය අංශය |
|---|---|
| ජනක විතානගේ<br>චන්දන කුමාර<br>ඉන්දිකා ප්‍රසාදිනී<br>හර්ෂ මනෝහර<br>එච්.ඒ. පී. සඳරුවන් | ප්‍රභාත් ජයසූරිය<br>උදයජීව ඒකනායක<br>නාලනී රත්නසේකර |
| **සාගර හා වෙරළ ආශ්‍රිත සම්පත් සංරක්ෂණ හා කළමනාකරණ වැඩසටහන** | **තුරුණු මිහිසරණිය හරිත සේනාංකය** |
| උපුල් ජයතිලක | එම්. එම්. ජයසීලන්<br>එම්. එන්. ආර්. මොහොමඩ් |

# 9. විගණන වාර්තාව